සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Department of Examinations - Sri Lanka

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

## 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

**ප්‍රශ්නපත්‍ර ව්‍යුහය**

**I පත්‍රය-** කාලය - පැය 02 යි.

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**IIපත්‍රය-** කාලය - පැය 03 යි.

මෙම ප්‍රශ්නපත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.

**I කොටස** - ව්‍යුහගත ප්‍රශ්න තුනකි. ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් පහකි. (I) කොටසට ලකුණු 02 කි. (II) කොටසට ලකුණු 03 කි. (III) කොටසට ලකුණු 04 කි. (IV) කොටසට ලකුණු 05 කි. (V) කොටසට ලකුණු 06 කි. එකතුව ලකුණු 20 කි.

**II කොටස** - රචනා වර්ගයේ ප්‍රශ්න පහකි. ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයක කොටස් දෙකකි. එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

**II පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

**අවසාන ලකුණු ගණනය කිරීම** :

| | | | |
|---|---|---|---|
| I | පත්‍රය | = | 100 |
| II | පත්‍රය | = | 100 |
| අවසාන ලකුණ | | = | 200 - 2 =100 |

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ :** ප්‍රශ්න අංක 03

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

Department of Examinations - Sri Lanka

AL/2021(2022)/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)**
**General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)**

| | | |
|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය I<br>பௌத்த நாகரிகம் I<br>Buddhist Civilization I | 45 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිලිමත් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

---

**1.** 'ආශ්‍රමධර්ම' පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව බ්‍රහ්මචාරී ආශ්‍රම අවධියෙහිදී විවිධ ශිල්ප ශාස්ත්‍ර අධ්‍යයනය කළ යුතු වන්නේ,

(1) බ්‍රාහ්මණයන් විසින් පමණි.
(2) ක්ෂත්‍රියයන් විසින් පමණි.
(3) බ්‍රාහ්මණයන් හා ක්ෂත්‍රියයන් විසින් පමණි.
(4) බ්‍රාහ්මණයන් හා වෛශ්‍යයන් විසින් පමණි.
(5) බ්‍රාහ්මණයන්, ක්ෂත්‍රියයන් හා වෛශ්‍යයන් විසින් පමණි.

**2.** බ්‍රාහ්මණ සමයාගත ආපද්ධර්ම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - බ්‍රාහ්මණයාට ක්ෂත්‍රියයාගේ කටයුතුවල නිරත විය හැකි ය.
B - බ්‍රාහ්මණයාට වෛශ්‍යයාගේ කටයුතුවල නිරත විය හැකි ය.
C - ක්ෂත්‍රියයාට වෛශ්‍යයාගේ කටයුතුවල නිරත විය හැකි ය.
D - වෛශ්‍යයාට ක්ෂත්‍රියයාගේ කටයුතුවල නිරත විය හැකි ය.
E - ශුද්‍රයාට වෛශ්‍යයාගේ කටයුතුවල නිරත විය හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශ දෙක වන්නේ,

(1) A සහ B ය. (2) B සහ C ය. (3) B සහ E ය. (4) C සහ D ය. (5) D සහ E ය.

**3.** සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හේතුවක් ප්‍රත්‍යයක් නැතැයි ඉගැන්වූ බුද්ධකාලීන ශාස්තෘවරයා කවුරුන් ද?

(1) අජිත කේසකම්බලී (2) මක්ඛලී ගෝසාල (3) පූරණ කස්සප
(4) පකුධ කච්චායන (5) සංජය බෙල්ලට්ඨිපුත්ත

**4.** බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සමාජය සම්බන්ධයෙන් වන **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) ඥාන මාර්ගය පිළිගනී. (2) කර්ම මාර්ගය ප්‍රතික්ෂේප කරයි.
(3) චින්තන නිදහස අගය කරයි. (4) අගාරික ප්‍රතිපදාව අනුමත කරයි.
(5) අන්තගාමී තාපස චර්යා පිළිගනී.

**5.** ක්‍රි.පූ. හයවන සියවසේ භාරත දේශයේ නගර නිර්මාණයට හා නාගරීකරණයට බල පෑ ප්‍රමුඛතම සාධකය ලෙස හඳුනාගත හැක්කේ,

(1) සිටුවර පන්තියක් බිහි වීමයි.
(2) යුද ගැටුම් ඉහළ යාමයි.
(3) කෘෂි නිෂ්පාදන වර්ධනය වීමයි.
(4) ජනගහනය වැඩි වීමයි.
(5) ජනතාව සුඛෝපභෝගිත්වයට නැඹුරු වීමයි.

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations - Sri Lanka

6. මහා කච්චායන මහරහතන් වහන්සේගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය චණ්ඩපජ්ජෝත රජතුමා බුද්ධකාලීන ............................ රාජ්‍යයේ පාලකයා විය.
(1) වත්ස (2) කාසි (3) අවන්ති (4) මත්ස්‍ය (5) කුරු

7. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ අතර 'විජ්ජාචරණ සම්පන්න' ගුණය ලෙස හැඳින්වෙන්නේ,
(1) ත්‍රිවිද්‍යා ඥාන හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවීම ය.
(2) චතුර් වෛශාරද්‍ය ඥාන හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවීම ය.
(3) පංච අභිඥා හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවීම ය.
(4) ෂඩ් අභිඥා හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවීම ය.
(5) අෂ්ට විද්‍යා හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවීම ය.

8. බුදුරජාණන් වහන්සේගේ 'පද්මාකාර ජීවිතය' පැහැදිලි කෙරෙන ප්‍රකාශය වන්නේ,
(1) මහා කරුණා සමාපත්තියෙන් ලෝකය දෙස බැලීමයි.
(2) කෙලෙස්වලින් ආතුර වූවන් අතර අනාතුරව, නොකිලිටිව වාසය කිරීමයි.
(3) සිවු කුලයටම අයත් ශ්‍රාවකයන් සංඝ සමාජයට ඇතුළත් කර ගැනීමයි.
(4) වරින් වර අන්‍ය තීර්ථක ආරාමවලට වැඩමවා ධර්ම දේශනා කිරීමයි.
(5) අන්‍ය ආගමිකයන් හා දාර්ශනිකයන් සමග සුහදශීලීව කටයුතු කිරීමයි.

9. බෙදුයෙන් දහම් කඳ
බජනය කෙලෙන් ගුණකඳ
බග දහමින් සසඳ
............................ ..........
යනාදී පද්‍යයෙන් විස්තර වන බුදුගුණය කුමක් ද?
(1) සුගත (2) ලෝකවිදූ (3) අරහං (4) බුද්ධ (5) භගවා

10. විවිධ ආගමික මතවාදවල වහලුන් වී සිටි භාරතීය ජනතාවගේ ආත්ම ශක්තිය හා ස්වාමිත්වය තහවුරු කිරීමෙහිලා උත්තේජනයක් ඇති කිරීමට සමත් වූ බුද්ධ දේශනාවක් වන්නේ,
(1) 'තමන් කළ සියලු කර්මවල විපාක තමන්ම විඳිය යුතු ය' යන්නයි.
(2) 'විමුක්තිය ලබා ගැනීම හෝ නො ගැනීම තම තමන්ගේ පෞද්ගලික වගකීමකි' යන්නයි.
(3) 'අරිඅටඟිමග හැර වෙනත් නිවන් මගක් නැත' යන්නයි.
(4) 'උසස් කළ හැකි මනසක් ඇති එකම සත්ත්වයා මනුෂ්‍යයාය' යන්නයි.
(5) 'බුදුවරුන්ගේ පහළවීම ලොවට සුව එළවයි' යන්නයි.

11. අග්‍ර බුද්ධෝපස්ථායක ආනන්ද හිමියන් වෙත පැවරුණු වගකීමක් **නො වූයේ,**
(1) ආනන්ද හිමියන් විසින් කරනු ලබන ආරාධනා බුදුරජාණන් වහන්සේ පිළිගත යුතු වීමයි.
(2) ජේතවනාරාමයට පැමිණෙන ආගන්තුක සංඝයාට අවශ්‍ය සිවුපස ලබාදීමට සංවිධානය කිරීමයි.
(3) බැහැරින් පැමිණෙන කවරෙකු හෝ කැමති ඕනෑම වේලාවක බුදුරජාණන් වහන්සේ මුණ ගැස්සවීමට අවසර තිබීමයි.
(4) සැකයක් මතු වූ කෙණෙහිම බුදුරජාණන් වහන්සේගෙන් එය විමසීමට අවසර තිබීමයි.
(5) අනභිමුඛයේදී බුදුරදුන් දෙසූ ධර්මය නැවත වරක් දේශනා කරවා අසා දරා ගැනීමයි.

12. මහා ප්‍රජාපතී ගෝතමිය හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අග්‍ර වීම
(2) විශාලා මහනුවර කූටාගාර ශාලාවේදී පැවිදි උපසම්පදාව ලැබීම
(3) කපිලවස්තුවේ නිග්‍රෝධාරාමය ඉදි කිරීමේ ප්‍රධාන දායිකාව වීම
(4) ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රථම උපසපන් භික්ෂුණිය වීම
(5) විශාලා මහනුවර භික්ෂුණී ආරාමයේදී ඍද්ධි ප්‍රාතිහාර්ය පා පිරිනිවන් පෑම

13. පුද්ගල ශක්තිය තහවුරු කිරීමට ධර්මයේ භාවිත **නො කෙරෙන** යෙදුම කුමක් ද?
(1) විඤ්ඤාණ ධාතු (2) ආරම්භ ධාතු (3) නික්කම ධාතු
(4) පරක්කම ධාතු (5) උපක්කම ධාතු

Department of Examinations - Sri Lanka

**14.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මහාජන සම්මතයෙන් තෝරාගත් බැවින්, රජු 'මහා සම්මත' නම් වේ.
B - කෙත් වතුවලට අධිපති බැවින්, රජු 'ඛත්තිය' නම් වේ.
C - දැහැමිව ජනයා රංජනය කරන බැවින්, පාලකයා 'රාජා' යනුවෙන් හැඳින්වේ.
D - වැරදිකරුවන්ට දඬුවම් දීම පාලකයාගේ ප්‍රධාන වගකීමක් වේ.
E - රජයට බදු ගෙවීම ජනතාවගේ යුතුකමක් වේ.

දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ විස්තරයට අනුව ඉහත ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,

(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

**15.** පහත සඳහන් කරුණු අතුරෙන් සප්ත අපරිහානීය ධර්මවලට අයත් **නො වන** ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

A - දිළිඳුන්ට ධනය උපයා ගැනීමට හැකි අවස්ථා වැඩි දියුණු කළ යුතු ය.
B - රටේ අපරාධ මර්දනය කොට නීතිය හා සාමය ස්ථාපනය කළ යුතු ය.
C - විවාහක අවිවාහක කාන්තාවන් ආරක්ෂා කළ යුතු ය.
D - වැඩිහිටියන්ට ගෞරව දක්වා ඔවුන්ගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය.
E - රටේ පෞරාණික-වැදගත් පූජනීය ස්ථාන ආරක්ෂා කොට නඩත්තු කළ යුතු ය.

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) A සහ E (5) B සහ C

**16.** බුදුදහමේ උගන්වන ශ්‍රද්ධාව පිළිබඳව **නො ගැළපෙන** අදහස ඇතුළත් වරණය තෝරන්න.

(1) අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව යනුවෙන් ශ්‍රද්ධාව දෙයාකාර වේ.
(2) අමූලිකා ශ්‍රද්ධාව විශ්වාසය, භක්තිය, ඇදහීම වැනි මනෝභාවයන් හා සම වේ.
(3) බුද්ධාදී රත්නත්‍රයේ ගුණ දැක, දැන අවබෝධය මත ඇති කරගන්නා පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව නම් වේ.
(4) ආකාරවතී ශ්‍රද්ධාව මෙන්ම අමූලිකා ශ්‍රද්ධාව ද බුදුසමය අගය කරයි.
(5) ශ්‍රද්ධාව, බෞද්ධ පිළිවෙත අනුගමනය කිරීමට හා ප්‍රඥා ප්‍රතිලාභයට මෙහෙය වන මනෝභාවයකි.

**17.** දස අකුසල්වල දැක්වෙන කායික හා වාචසික අකුසලය බැගින් ඇතුළත් වරණය කුමක් ද?

(1) ප්‍රාණඝාතය සහ අදත්තාදානය
(2) කාම මිථ්‍යාචාරය සහ මුසාවාදය
(3) කේලාම් කීම සහ පරුෂ වචන කීම
(4) හිස්වචන කීම සහ අභිධ්‍යාව
(5) ව්‍යාපාදය සහ මිථ්‍යාදෘෂ්ටිය

**18.** පහත දැක්වෙන්නේ බෞද්ධ ඉගැන්වීම්වල එන ප්‍රසිද්ධ ප්‍රකාශ කිහිපයකි.

A - රාග-ද්වේශ-මෝහ සහගත ක්‍රියා අසාධු පාප ක්‍රියා ලෙස කාලාම සූත්‍රය පැහැදිලි කරයි.
B - අත්තූපනායික ධර්ම පර්යායට අනුව හොඳ නරක නිශ්චය කළ හැකි ය.
C - කැඩපතකින් තමාම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.
D - යම් ක්‍රියාවක් කොට පසුතැවිල්ලට පත්වේ ද කඳුළු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවේ ද එවැනි පාප ක්‍රියා නොකළ යුතු ය.
E - නිරෝගී සුවය පරම ලාභය ද සතුට පරම ධනය ද විශ්වාසවන්තයා පරම ඥායා ද වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් හොඳ නරක විනිශ්චයෙහිලා භාවිත කළ හැකි නිර්ණායක ලෙස සැලකිය හැක්කේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) A සහ D පමණි. (4) A, B, C සහ D පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ල ම ය.

Department of Examinations - Sri Lanka

19. පංචසීල ප්‍රතිපදාවට අනුව පුද්ගලයාගේ ජීවත්වීමේ අයිතිය හා දැහැමිව උපයන ලද සම්පත් තමන් සතුව තබා ගැනීමේ අයිතිය තහවුරු කරන ශික්ෂා පද දෙක වන්නේ,
(1) ප්‍රාණ ඝාතයෙන් හා අදත්තාදානයෙන් වැළකීමයි.
(2) ප්‍රාණ ඝාතයෙන් හා කාම මිථ්‍යාචාරයෙන් වැළකීමයි.
(3) ප්‍රාණ ඝාතයෙන් හා මුසාවාදයෙන් වැළකීමයි.
(4) ප්‍රාණ ඝාතයෙන් හා සුරාවෙන් වැළකීමයි.
(5) අදත්තාදානයෙන් හා කාම මිථ්‍යාචාරයෙන් වැළකීමයි.

20. සෞන්දර්ය රසාස්වාදය බුදුසමයට අනුචිත නො වූවකි. බුදුරජාණන් වහන්සේ මෙන්ම වීතරාගී උතුමන් ද නිරාමිස සෞන්දර්ය රසාස්වාදය කළ බව බෞද්ධ මූලාශ්‍රයවල දක්නට ලැබේ. බෞද්ධ විග්‍රහයට අනුව සෞන්දර්ය රසාස්වාදයේ පදනම ලෙස හඳුනාගත හැක්කේ,
(1) සුඛාස්වාදයයි. (2) ප්‍රසාදය සහ නිර්වේදයයි.
(3) ශ්‍රද්ධාව ජනිත කරවීමයි. (4) ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමයි.
(5) කර්මඵල විශ්වාසයයි.

21. ශ්‍රමය හා ධනය අතර සම්බන්ධය වඩාත් පැහැදිලිව අවධාරණය කොට ඇති සූත්‍රයක් වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රයයි. (2) පත්තකම්ම සූත්‍රයයි. (3) අනණ සූත්‍රයයි.
(4) ඉණ සූත්‍රයයි. (5) මංගල සූත්‍රයයි.

22. පහත සඳහන් ඡේදය කියවා හිස්තැනට වඩාත් සුදුසු වරණය තෝරන්න.

වේයෙකු තුඹසක් ගොඩනගන්නාක් මෙන්, බෞද්ධ ආර්ථික මූලධර්මවලට අනුගතව පියවරින් පියවර සිය ආර්ථිකය සමෘද්ධිමත් කරගත් රත්න ශ්‍රී මුදලාලි සිය සම්පත් දෙස බලා සතුටු වූයේ හුදෙක් විශාල ධනයක් තමා සතු වීම නිසා ම නොවේ.

ණය වී සිය ව්‍යාපාරය දියුණු කර ගැනීමට තීරණය නො කළ ඔහු නිසි මුදල් කළමනාකරණය මත විශ්වාසය තබා, ලාභය එකම අරමුණ සේ නො සලකා අවංකවම ගුණාත්මක සේවයක් සිය පාරිභෝගිකයන් වෙත ලබා දීමට හැමවිටම උත්සාහ කෙළේ ය. එයම රත්න ශ්‍රී මුදලාලිගේ ව්‍යාපාරය දිනෙන් දින දියුණුවීමේ රහස වූ අතර, බෞද්ධයෙකු ලෙස අකුසල්වලින් මිදී කටයුතු කිරීමට ද හෙතෙම හැමවිට ම උත්සාහ කළේ ඉන් ලැබෙන මානසික සුව සහනය ද සලකා ගෙනයි.

සිය ව්‍යාපාරයෙන් ලැබෙන ලාභය ආයෝජනයට මෙන්ම පරිභෝජනයට ද නිසි පරිදි යෙද වූ ඔහු අජද්ධුමාරික හා උදුම්බරඛාදික යන සාවද්‍ය පරිභෝජනයෙන් ද වැළකී සතුටින් ව්‍යාපාරික කටයුතු කෙළේ ය.

ඉහත විස්තරයට අනුව රත්න ශ්‍රී මුදලාලි .............................. හොඳින් අත්වින්දේ ය.
(1) අත්ථි සුඛය
(2) අත්ථි සුඛය සහ භෝග සුඛය
(3) අත්ථි සුඛය සහ අනණ සුඛය
(4) අත්ථි සුඛය, භෝග සුඛය සහ අනණ සුඛය
(5) අත්ථි සුඛය, භෝග සුඛය, අනණ සුඛය සහ අනවජ්ජ සුඛය

23. සූත්‍ර පිටකාගත පංචබලි සංකල්පයෙන් ඉදිරිපත් කොට ඇත්තේ .............................. පිළිබඳ සිද්ධාන්තයකි.
(1) ධනෝපායනය (2) ධන සංරක්ෂණය
(3) ධන කළමනාකරණය (4) ධන පරිභෝජනය
(5) ධන ආයෝජනය

24. සිගාලෝවාද සූත්‍රයට අනුව උතුරු හා දකුණු දිසාවන්ගෙන් නියෝජනය වන්නේ,
(1) දෙමාපියන් සහ ගුරුවරුන් ය. (2) පැවිදි උතුමන් සහ ගුරුවරුන් ය.
(3) මිත්‍රයන් සහ ගුරුවරුන් ය. (4) පැවිදි උතුමන් සහ දෙමාපියන් ය.
(5) මිත්‍රයන් සහ දෙමාපියන් ය.

25. අටතිස් මංගල කරුණු අතුරෙන් 'සන්තුට්ඨි' යනුවෙන් අදහස් වන්නේ,
(1) ලද දෙයින් සෑහීමට පත්වීමෙන් ලබන සතුටයි.
(2) නිවැරදිව ජීවත්වීමෙන් ලබන සතුටයි.
(3) යුතුකම් ඉටු කිරීමෙන් ලබන සතුටයි.
(4) දන් දීමෙන් ලබන සතුටයි.
(5) සත්‍යාවබෝධයෙන් ලබන සතුටයි.

Department of Examinations - Sri Lanka

**26.** 'කරන කලට පව් මීරිය මී සේ' මෙම අදහස ගම්‍ය වන ධම්මපද ගාථා පාදය තෝරන්න.
(1) 'යො බාලො මඤ්ඤති බාල්‍යං' (2) 'චක්කංව වහතො පදං'
(3) 'මධුවා මඤ්ඤති බාලො' (4) 'අත්තනාව කතං පාපං'
(5) 'තණ්හාය ජායති සොකො'

**27.** බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ගේ දක්ෂතා හා හැකියාවන් සලකා බලා අගතනතුරු ප්‍රදානය කළ බව අංගුත්තර නිකායේ ඒතදග්ග පාළියෙහි සඳහන් වේ. එසේ අගතනතුරුලාභී ශ්‍රාවකයන් වහන්සේලා කිහිප නමකගේ නම් සහ තනතුරු පහතින් දැක්වෙන අතර, ඉන් දෙනමකගේ පමණක් අගතනතුරු නිවැරදි ය.
A - පුණ්ණ මන්තානිපුත්ත මහ තෙරුන් – දිවැස්ලාභීන් අතර අගතනතුර
B - මහා කාශ්‍යප මහ තෙරුන් – ධූතංගධාරීන් අතර අගතනතුර
C - සැරියුත් මහ තෙරුන් – ඍද්ධිමතුන් අතර අගතනතුර
D - මුගලන් මහ තෙරුන් – ප්‍රඥාවන්තයින් අතර අගතනතුර
E - උපාලි මහ තෙරුන් – විනයධාරීන් අතර අගතනතුර
නම සහ තනතුර නිවැරදිව ගළපා ඇත්තේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) A සහ E පමණි. (5) B සහ E පමණි.

**28.** බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් හික්මවීමෙහිලා හඳුන්වා දෙන ලද විවිධ දඬුවම් ක්‍රම අතර 'බ්‍රහ්ම දණ්ඩනය' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) කිසියම් සීමාවක් ලකුණු කොට ඉන් පිටතට යාම තහනම් කිරීමයි.
(2) ගිහියන්ගෙන් සමාව ගැනීමට නියම කිරීමයි.
(3) සසුනින් නෙරපා හැරීමයි.
(4) දඬුවම්ලාභියා සමග කිසිවෙකු කතාබහ නො කොට හුදකලා කිරීමයි.
(5) පරිවාස කාලයක් ගත කිරීමට නියම කොට වෙනත් ගුරුවරයෙකු යටතට පත් කිරීමයි.

**29.** ප්‍රථම ධර්ම සංගායනාව අවසානයේදී ධර්ම-විනය පිරිසිදුව, මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ මහ තෙරුන් වහන්සේලාට හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවලට පවරා දෙනු ලැබීය. එලෙස පවරාදීම නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) දීඝ නිකාය – අනුරුද්ධ මහරහතන් වහන්සේට
(2) මජ්ඣිම නිකාය – ආනන්ද මහරහතන් වහන්සේට
(3) සංයුත්ත නිකාය – මහා කාශ්‍යප මහරහතන් වහන්සේට
(4) අංගුත්තර නිකාය – මහා කච්චායන මහරහතන් වහන්සේට
(5) ඛුද්දක නිකාය – සීවලී මහරහතන් වහන්සේට

**30.** යස හිමියන් විශාලා මහනුවරට පැමිණි කල්හි වජ්ජිපුත්තක භික්ෂූන් මුදල් සම්මාදමේ යෙදී සිටිනු දැක එයට එරෙහි වූ විට වජ්ජිපුත්තක භික්ෂූන් විසින් යස හිමියන්ට දඬුවම් පැමිණවීමට උත්සාහ කරන ලදී. එසේ පැනවීමට උත්සාහ කරන ලද දඬුවම් විනයකර්ම දෙක වනුයේ,
(1) පටිසාරණීය කර්මය සහ පබ්බාජනීය කර්මයයි.
(2) පටිසාරණීය කර්මය සහ උක්ඛෙපනීය කර්මයයි.
(3) උක්ඛෙපනීය කර්මය සහ පබ්බාජනීය කර්මයයි.
(4) උක්ඛෙපනීය කර්මය සහ තජ්ජනීය කර්මයයි.
(5) තජ්ජනීය කර්මය සහ පබ්බාජනීය කර්මයයි.

**31.** වජ්ජිපුත්තක භික්ෂූන් කැපයැයි පිළිගෙන ඉදිරිපත් කරන ලද දස වස්තුවෙහි දැක්වෙන 'අමථිත කප්ප' යන්නෙන් අදහස් කරන ලද්දේ,
(1) වරක් වළඳා අවසන් කොට වෙනත් ගමකට ගොස් එහිදී නැවත වැළඳීම කැප බව ය.
(2) අඟක ලුණු බහා තබාගෙන ලුණු රහිත ආහාරයක් ලැබුණු විට මිශ්‍රකර වැළඳීම කැප බව ය.
(3) රාත් නොවූ, මීරාත් නොවූ, රා වැළඳීම කැප බව ය.
(4) එක් සීමාවක් තුළ වාසය කරන භික්ෂූන්ගේ ඡන්දය ලබා නො ගෙන වෙන් වෙන් ව පොහොය කර්මය කොට පසුව ඡන්දය ලබා ගැනීම කැප බව ය.
(5) කිරිත් නොවූ, දී-කිරිත් නොවූ, නො මිදුණු කිරි විකාලයේ වැළඳීම කැප බව ය.



Department of Examinations - Sri Lanka

**32.** දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් **නොවන්නේ,**
(1) ධර්ම-විනය සුරක්ෂිතව පවත්වා ගෙන යාම සඳහා භික්ෂු කණ්ඩායම්වලට පැවරීමයි.
(2) ස්ථවිරවාද හා මහාසංඝික වශයෙන් භික්ෂූන් දෙකොටසකට බෙදීමයි.
(3) ස්ථවිරවාදීන් නිකාය 12ක් දක්වා බෙදී යාමට මුල පිරීමයි.
(4) මහායානයේ ආරම්භයට මූල බීජ මතුවීමයි.
(5) අලජ්ජී පාපී භික්ෂූන් ලෙස නම්කොට දස දහසක් වජ්ජී භික්ෂූන් ථෙරවාද සම්ප්‍රදායෙන් ඉවත් කිරීමයි.

**33.** තුන්වැනි ධර්ම සංගායනාවෙන් පිරිසිදු කළ ධර්ම-විනය දේශාන්තරයෙහි ව්‍යාප්තිය සඳහා ධර්මදූතයන් වහන්සේලා පිටත් කළ බව ඓතිහාසික වාර්තාවල සඳහන් වේ. එම වාර්තාවලට අනුව මහිස මණ්ඩලයට වැඩම කරන ලද ධර්මදූතයන් වහන්සේ වූයේ,
(1) මජ්ඣන්තික හිමියන් ය.
(2) මහාධම්මරක්ඛිත හිමියන් ය.
(3) මජ්ඣිම හිමියන් ය.
(4) මහාදේව හිමියන් ය.
(5) මහාරක්ඛිත හිමියන් ය.

**34.** ථෙරවාද බෞද්ධ ධර්ම සංගායනාවන්හි ප්‍රතිඵල කිහිපයක් පහත දැක්වේ.
A - බුද්ධ වචනය භාණක පරම්පරාවලට පැවරීම
B - දස වස්තුව විනය විරෝධීයැයි තීරණය කිරීම
C - සූත්‍ර-විනය-අභිධර්ම වශයෙන් ත්‍රිපිටකය සම්පූර්ණ වීම
D - නවරට සසුන් පිහිටු වීම
E - ක්ෂුද්‍රා අනුක්ෂුද්‍රා ශික්ෂා පද වෙනස් නො කිරීමට තීරණය කිරීම
ඉහත සඳහන් කරුණු අතුරෙන් පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) A සහ E (5) B සහ C

**35.** භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාල අතර ප්‍රමුඛතම විශ්වවිද්‍යාලය ලෙස සැලකෙන නාලන්දා විශ්වවිද්‍යාලයට අවශ්‍ය විවිධ ගොඩනැගිලි ඉදිකර දී සුවිශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස නම් කරන ලද්දේ, ක්‍රි.ව. 415 සිට 455 දක්වා රාජ්‍යය කරවූ .............................. රජු විසිනි.
(1) ශක්‍රාදිත්‍ය (2) බාලාදිත්‍ය (3) වික්‍රමාදිත්‍ය
(4) බුද්ධ ගුප්ත (5) තථාගත ගුප්ත

**36.** ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවති වන්දනා-ඇදහිලි හා විශ්වාස අතර දේශීය ප්‍රභවයක් **නො වන** වන්දනය කුමක් ද?
(1) වෘක්ෂ වන්දනය (2) ශිව වන්දනය
(3) නාග වන්දනය (4) යක්ෂ වන්දනය
(5) ග්‍රහ තාරකා වන්දනය

**37.** ලක්දිවට බුදුදහම හඳුන්වා දීමෙන් අනතුරුව මිහිඳු මාහිමියන් ලක්දිවදී පළමුවරට වස් සමාදන්ව වැඩසිටි ස්ථානය ලෙස සැලකෙන්නේ,
(1) මිහින්තලයයි.
(2) දෙවන පෑතිස් රජ මාලිගයයි.
(3) කාල ප්‍රාසාදයයි.
(4) ඉසුරුමුණියයි.
(5) වෙස්සගිරියයි.

**38.** සංඝමිත්තා මහ තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලා ලක්දිවට වැඩම කරවීමේ ප්‍රමුඛ අරමුණ වූයේ,
(1) ශ්‍රී මහා බෝධි අංකුරය ලක්දිවට වැඩම කරවීමයි.
(2) අනුලා බිසව පැවිදි කිරීමයි.
(3) ලක්දිව පුරා බුදුසමය ව්‍යාප්ත කිරීමයි.
(4) ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව ජනප්‍රිය කිරීමයි.
(5) භික්ෂුණී ශාසනය ලක්දිව ස්ථාපනය කිරීමයි.

Department of Examinations - Sri Lanka

**39.** මහාවිහාරයට ප්‍රතිපක්ෂව අභයගිරි සම්ප්‍රදාය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටුකළ චරිත යුගලය ලෙස හඳුනාගත හැක්කේ,
(1) කුපික්කල මහාතිස්ස හිමි සහ වළගම්බා රජු ය.
(2) ගෝඨගත්තතිස්ස හිමි සහ වළගම්බා රජු ය.
(3) කුපික්කල මහාතිස්ස හිමි සහ මහසෙන් රජු ය.
(4) කුපික්කල මහාතිස්ස හිමි සහ කිත්සිරිමෙවන් රජු ය.
(5) ගෝඨගත්තතිස්ස හිමි සහ මහසෙන් රජු ය.

**40.** ලක්දිවට බුදුසමය හඳුන්වා දීමෙන් අනතුරුව බෞද්ධ ඉගැන්වීම් පදනම් කරගත් ජීවන රටාවකට හුරු වූ පැරණි ලක්වැසියෝ පරෝපකාරය හා සහජීවනය ජීවිතයට අත්‍යවශ්‍ය අංග ලෙස සැලකූහ. ආහාර පාන, භාණ්ඩ මෙන්ම ශ්‍රමය ද සාමූහිකව බෙදාගෙන පරිහරණය කිරීමට ඔවුහු හුරු වූහ. එසේ එකිනෙකා අතර ශ්‍රමය බෙදා හදාගෙන කටයුතු කිරීම .............................. ලෙස හඳුන්වන ලදී.
(1) රාජකාරි ක්‍රමය (2) ගනුදෙනු ක්‍රමය (3) අත්තම් ක්‍රමය
(4) නින්දගම් ක්‍රමය (5) අඳ ක්‍රමය

**41.** උපතේ සිට මරණය දක්වා බෞද්ධ උරුව අනුව ජීවිත හැඩ ගස්වාගත් පැරණි ශ්‍රී ලාංකිකයෝ විවිධ අරමුණු සපුරා ගැනීමට පාරම්පරික විශ්වාස අනුව කටයුතු කළහ. කුඩා දරුවන්ගේ ගෙලෙහි 'පංචායුධය' පැළඳවීම ද කිසියම් අපේක්ෂාවකින් සිදු කළ චාරිත්‍රයකි. ඒ අනුව පංචායුධය පැළඳවීමේ අපේක්ෂාව වූයේ,
(1) තෙරුවනේ ආශීර්වාදය ලබා ගැනීමයි.
(2) දේවාශීර්වාදය ලබා ගැනීමයි.
(3) අනිවාර්ය චාරිත්‍රයක් ඉටු කිරීමයි.
(4) විවිධ උවදුරුවලින් ආරක්ෂා කර ගැනීමයි.
(5) සෞභාග්‍යය උදාකර ගැනීමයි.

**42.** මහාවිහාරික භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙළඹවූ ආසන්නතම හේතුව ලෙස සැලකිය හැක්කේ,
(1) පර සතුරු ආක්‍රමණ බහුල වීමයි.
(2) අභයගිරිකයන් විසින් බුද්ධ වචනය සංශෝධනය කිරීමට සූදානම් වීමයි.
(3) ථෙරවාදයට පටහැනි මිථ්‍යා මත ව්‍යාප්ත වීමයි.
(4) රාජ්‍ය පාලනය දුර්වල වීමයි.
(5) ත්‍රිපිටකය කට පාඩමින් පවත්වාගෙන යාමට දුෂ්කරතා නිර්මාණය වීමයි.

**43.** ක්‍රි.ව. 11වන සියවසේදී ථටෝන් නුවර ආක්‍රමණය කොට එහි තිබූ ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ පුරාවස්තු හා භික්ෂූන් වහන්සේලා පගාන් නුවරට ගෙන්වා, ලංකාවේ ත්‍රිපිටකය හා සසඳා, ත්‍රිපිටකයේ නිරවද්‍යතාව තහවුරු කොට බුරුමයේ පිරිසිදු ථෙරවාද බුදුසමයේ ව්‍යාප්තියට ප්‍රමුඛ දායකත්වයක් දක්වන ලද්දේ .............................. රජු විසිනි.
(1) කෙයංසිත්ථ
(2) අනව්රථ
(3) මින් ඩොං මිං
(4) අලෞංසිථු
(5) නරපතිසිථු

**44.** ලොව පරමාදර්ශී සංඝ සංවිධානයක් ලෙස සැලකෙන ථායි සංඝ සංවිධානය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සංඝ ව්‍යවස්ථාව රාජ්‍ය ව්‍යවස්ථාවට සමාන වීම නිසා සියලු බලතල රජු සතු වීම
(2) මහා සංඝ පරිණායක හෙවත් සංඝරාජ හිමියන් සංඝ සංවිධානයේ නායකත්වය දැරීම
(3) ප්‍රධාන සංඝ පරිපාලන සංවිධානය කොටස් හතරකින් යුක්ත වීම
(4) ධර්ම විනයධර භික්ෂූන් 45 දෙනෙකුගෙන් සමන්විත සංඝ සභාවක් හරහා පාලන කටයුතු සිදු කිරීම
(5) සංඝරාජ හිමියන් විසින් පත්කරනු ලබන පස්දෙනෙකුගෙන් සමන්විත සංඝ අමාත්‍ය මණ්ඩලයකින් සංඝයා පාලනය කිරීම

Department of Examinations - Sri Lanka

45. ජපන් බෞද්ධයා තුළ ආගමික භක්තිය ප්‍රකට වන අවස්ථාවන් ලෙස එරට බෞද්ධ උත්සව හැඳින්විය හැකි ය. වසර පුරාම විවිධ බෞද්ධ උත්සව පැවැත්වෙන අතර බුදුරජාණන් වහන්සේගේ තෙමගුල සිහිකිරීමට උත්සව තුනක් වාර්ෂිකව පවත්වනු ලැබේ. බුද්ධත්වයට පත්වීම හා බුද්ධ පරිනිර්වාණය සිහි කිරීමට පවත්වන උත්සව දෙක .......................... නමින් හැඳින්වේ.

(1) ජෝදෝ සහ හනමත්සුරි
(2) ඔබොන් සහ නෙහං
(3) හනමත්සුරි සහ ඔබොන්
(4) ජෝදෝ සහ නෙහං
(5) ජෝදෝ සහ ඔබොන්

46. චීන බුදුසමයේ ව්‍යාප්තිය සඳහා භාරතීය හා මධ්‍ය ආසියානු භික්ෂූන්ගෙන් සිදු වූ මෙහෙය විශාල ය. චීනයට වැඩම කර කාශ්‍යප මාතංග හිමියන් සමග එක් වී ලෝයාන්හි ධවල අශ්වාරාමයේ වැඩ සිටිමින් බෞද්ධ පොත්පත් රාශියක් චීන භාෂාවට පරිවර්තනය කරන ලද මධ්‍ය ආසියානු භික්ෂුවක් වන්නේ,

(1) බෝධිධර්ම හිමියන් ය.
(2) අශ්වඝෝෂ හිමියන් ය.
(3) චූපාලන් හිමියන් ය.
(4) ශාන්තරක්ෂිත හිමියන් ය.
(5) ධර්මාකර හිමියන් ය.

47. සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේදී බුදුගුණ හා ජාතක කථා තේමා කරගත් පද්‍ය කෘතීන් රාශියක් රචනා කොට ඇත. ජාතක කථාවක් තේමා කරගෙන එසේ රචනා වූ පද්‍ය කෘතියක් වන්නේ,

(1) බුදුගුණාලංකාරයයි.
(2) ලෝවැඩ සඟරාවයි.
(3) පැරකුම්බා සිරිතයි.
(4) හංස සන්දේශයයි.
(5) කාව්‍යශේඛරයයි.

48. බෝධීන් වහන්සේ වටා පටු පියස්සක් සහිතව ඉදි කරනු ලැබූ බෝධිඝරය ශ්‍රී ලංකාවට අනන්‍ය වූ කලා නිර්මාණයකි. මෙම බෝධිඝර අතර දැනට තරමක් දුරට හොඳින් ආරක්ෂා වී ඇති කලාත්මක අගයෙන් අනූන බෝධිඝරය පිහිටා ඇත්තේ,

(1) මහ ඉලුක්පල්ලමෙහි ය.
(2) පන්කුලියෙහි ය.
(3) වෙස්සගිරියෙහි ය.
(4) නිල්ලක්ගම ය.
(5) පුලියන්කුලමෙහි ය.

49. ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණය සඳහා භාරතයේ සාංචි ස්තූපය පූර්වාදර්ශ කරගෙන තිබුණ ද දේශීය අනන්‍යතාව ප්‍රදර්ශනය කළ අංග ද කලින් කලට ස්තූප නිර්මාණයට එක්කර තිබේ. ඒ අනුව පහත සඳහන් ස්තූප අංග අතුරෙන් දේශීය අනන්‍යතාවක් **නො වන** අංගය කුමක් ද?

(1) වටදාගෙය
(2) ප්‍රදක්ෂිණාපථය
(3) පේසා වළලු
(4) කොත් කැරැල්ල
(5) චූඩා මාණික්‍යය

50. භාරතීය බුද්ධ ප්‍රතිමා කලාවේ සංවර්ධනය සඳහා ගන්ධාර හා මථුරා සම්ප්‍රදායයන්ගෙන් සුවිශේෂ දායකත්වයක් ලැබුණු බව ඒ ඒ සම්ප්‍රදායයන්ට අනන්‍ය වූ ලක්ෂණවලින් තහවුරු වේ. ඒ අනුව පහත සඳහන් ප්‍රතිමා ලක්ෂණ අතුරෙන් මථුරා සම්ප්‍රදායට අයත් ලක්ෂණය තෝරන්න.

(1) මහා කාරුණික ලීලාව
(2) අත් සංවරව සිරුරට ලංව තිබීම
(3) නෙත් අඩවන්ව තිබීම
(4) පද්මාසනය මත දුෂ්කරව වැඩ සිටිනා විලාසයක් පෙන්නුම් කිරීම
(5) හිස කෙස් ගෙලිගතව කැරලි ගැසී තිබීම

* * *

Department of Examinations - Sri Lanka

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம: **45**

විෂයය / பாடம்: **බෞද්ධ ශිෂ්ටාචාරය**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | නිවැරදි පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 2 | 21. | 2 | 31. | 5 | 41. | 4 |
| 02. | 5 | 12. | 3 | 22. | 5 | 32. | 1 | 42. | 5 |
| 03. | 2 | 13. | 1 | 23. | 4 | 33. | 4 | 43. | 2 |
| 04. | 4 | 14. | 5 | 24. | 3 | 34. | 4 | 44. | 1/3 |
| 05. | 2 | 15. | 1 | 25. | 1 | 35. | 1 | 45. | 4 |
| 06. | 3 | 16. | 4 | 26. | 3 | 36. | 2 | 46. | 3 |
| 07. | 5 | 17. | 2 | 27. | 5 | 37. | 1 | 47. | 5 |
| 08. | 2 | 18. | 4 | 28. | 4 | 38. | 5 | 48. | 4 |
| 09. | 5 | 19. | 1 | 29. | 3 | 39. | 1 | 49. | 2 |
| 10. | 2 | 20. | 2 | 30. | 2 | 40 | 3 | 50 | 5 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

**45 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04යි.)
   (iv) බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සබඳතා උදාහරණ **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) පූරණ කස්සපගේ අකිරියවාදී දර්ශනය සැකෙවින් හඳුන්වා, එය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 06යි.)

2. (i) බුදුරජාණන් වහන්සේ 'සුගත' නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය ප්‍රකට වන අවස්ථා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ ආගමික සහනශීලී ගුණය උදාහරණ **හතරක්** ඇසුරින් ප්‍රකට කරන්න. (ලකුණු 04යි.)
   (iv) විශාඛා මහෝපාසිකාවගේ චරිත කථාව ඇසුරින් ගිහි ජීවිතයක සාර්ථකත්වය සඳහා ලබා ගත හැකි ආදර්ශ **පහක්** පෙන්වා දෙන්න. (ලකුණු 05යි.)
   (v) වර්තමාන සමාජ ගැටලු අවම කරගැනීමෙහිලා පංචසීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල විස්තර කරන්න. (ලකුණු 06යි.)

3. (i) "ජයං වෙරං පසවති " යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඉහත (i) හි සඳහන් කරන ලද ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)
   (iii) ගුරු-ශිෂ්‍ය යුතුකම් හා වගකීම් **දහය** සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04යි.)
   (iv) ගිහි ජීවිතයක පරිහානියට බලපාන හේතු වළක්වා ගැනීමෙන් දියුණුව උදාකර ගත හැකි බව පරාභව සූත්‍රාගත සාධක **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)
   (v) සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආර්ථික සුරක්ෂිතතාව පිණිස ඉවහල් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06යි.)

Department of Examinations - Sri Lanka

## II කොටස

4. (i) උපත පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා උසස්-පහත් ලෙස වර්ගීකරණය කළ **නො හැකි බව** බෞද්ධ මූලාශ්‍රය සාධක ඇසුරින් පහදන්න. (ලකුණු 10යි.)

(ii) "ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව සැලසීම රජුගේ ප්‍රධාන වගකීමකි." බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම ඇසුරින් විමසන්න. (ලකුණු 10යි.)

5. (i) බුද්ධකාලීන ධර්මදූත සේවාවේ සාර්ථකත්වය සඳහා බලපෑ හේතු සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

(ii) සෞන්දර්ය රසාස්වාදය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විවරණය කරන්න. (ලකුණු 10යි.)

6. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ හේතු සාධක පැහැදිලි කර, එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න. (ලකුණු 10යි.)

(ii) කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවය ප්‍රමාණවත් සාධක දක්වමින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

7. (i) නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන හා පරිපාලන ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුකූලව හැඩ ගැසුණු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

8. (i) ලක්දිව බුදුසසුනේ චිරස්ථිතිය සඳහා මහාවිහාරයෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) "සඳකඩපහණ හෙළ කලාකරුවාගේ අද්විතීයත්වය විදහා දක්වන විශිෂ්ට නිර්මාණයකි." විමසන්න. (ලකුණු 10යි.)

* * *

Department of Examinations - Sri Lanka

# 45 - බෞද්ධ ශිෂ්ටාචාරය

## II පත්‍රය

### I කොටස

**01. (i) බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න.**

- මනුස්මෘතියේ 1.88 ශ්ලෝකයෙන් දැක්වෙන පරිදි බ්‍රාහ්මණ වර්ණය වෙත පැවරෙන පහත දැක්වේ.
  අධ්‍යාපනමධ්‍යයනං - යජනං යාජනං තථා
  දානං ප්‍රතිග්‍රහං චෛව - බ්‍රාහ්මණානාමකල්පයත්.

  ඉගැන්වීම, ඉගෙනීම, යාග කිරීම, යාග කරවීම, දන් දීම, දන් පිළිගැනීම

  **(මෙයින් 04 ක් නම් කිරීම ප්‍රමාණවත්ය.)**

**(ලකුණු 02 යි)**

**01. (ii) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂ ලක්ෂණ තුනක් ගෙනහැර දක්වන්න.**

- සන්සුන් ඉඳුරන් ඇති, පිරිසිදු කසාවත් දරන, ශීලාදී ගුණ ධර්මයන්ගෙන් යුතු බිමට හෙළන ලද ඇස් ඇති, හිස රැවුලු මුඩු කළ, සංසුන්ව ගමන් කරන, සුපටිපන්න ආදී ගුණයන්ගෙන් සමන්විත පිරිසක් බව
- පිණ්ඩපාතිකව එක් වේලක් පමණ ආහාර ගන්නා සරල දිවි පෙවෙතක් ගත කරන පිරිසක් බව
- අටලෝදහමින් කම්පා නොවන අත්තකිලමථානුයෝගයෙන් හා කාමසුඛල්ලිකානුයෝගයෙන් බැහැර වූ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන පිරිසක් බව
- අතීතය හා අනාගතය පිළිබඳ ශෝක නොඋපදවන වර්තමානයෙන් යැපෙන ප්‍රසන්න පෙනුමෙන් යුත් පිරිසක් බව
- පුද්ගල ස්වාමීත්වය අගය කළ පිරිසක් බව
- පාරිශුද්ධ වූ කාය වාක් මනස් කර්ම ඇති බව
- අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුක්ත වූ බව
- ජිවන මූලික පරමාර්ථය කොට ගෙන ඊට අදාළ ප්‍රතිපත්ති පිරූ පිරිසක් බව
- සියලු දෘෂ්ටි ග්‍රහණයන්ගෙන් සහ උපාදානයන්ගෙන් තොර නිදහස් චින්තනය අනුව ක්‍රියා කළ පිරිසක් බව
- කාන්තා නිදහස තහවුරු කළ පිරිසක් බව
- කුල භේදය සපුරා බැහැර කර පිරිසක් බව

  **(මෙයින් කරුණු 03 ක් දැක්වීම ප්‍රමාණවත් ය)**

**(ලකුණු 03 යි)**

Department of Examinations - Sri Lanka

**01. (iii) බුද්ධකාලීන භාරතීය රාජාණ්ඩු පාලන ක්‍රමය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.**

- මගධ, කෝසල, වත්ස, අවන්ති යනුවෙන් මහාරාජ්‍ය හතරක් පැවති අතර ඒවා ප්‍රධාන රාජාණ්ඩු ලෙස සැලකීම
- මෙම රාජ්‍ය හතර තුළ රාජාණ්ඩු පාලන ක්‍රමය ක්‍රියාත්මක වීම
- රාජාණ්ඩුවක දක්නට තිබූ ප්‍රධාන ලක්ෂණ ලෙස ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණමය යන සියලු බලතල එක් රජකු සතු වීම
- ඒ අනුව නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම, දඬුවම් පැමිණවීම මහරජුගේ කාර්යයක් වීම
- ගාමිණි, ග්‍රාමභෝජක, නගරගුත්තික වැනි නිලධාරීන්ගෙන් හා රාජ භාණ්ඩාගාරික, විනිශ්චයකාර, අමාත්‍ය, මහාමාත්‍ය යන නිලධාරීන්ගෙන් සමන්විත වීම
- උපරාජ, යුවරාජ, පුරෝහිත, අධිකරණ නායක, ඇමති මණ්ඩලය, සේනාධිපති මගින් බලය ක්‍රියාත්මක කිරීම
- දුර්වල අසල්වැසි රාජ්‍යයන්හි පාලකයින් පරදවා තම බලය පුළුල් කර ගැනීමට මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කිරීම
- විවාහ සම්බන්ධතා මගින් වෙනත් රාජ්‍යයන් සම්බන්ධ කර තම බලය පුළුල් කර ගැනීම
- පිය-පුතු පරම්පරාවෙන් රාජ්‍යය උරුම වීම

**(ලකුණු 04 යි)**

**01. (iv) බුද්ධකාලීන පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සබඳතා උදාහරණ පහක් ඇසුරින් පැහැදිලි කරන්න.**

- මගධ, කෝසල, වත්ස, අවන්ති, වජ්ජි, මල්ල ආදී රාජ්‍යයන්හි රජ කළ පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර සමීප සම්බන්ධතා පැවතීම
- **මගධාධිපති බිම්බිසාර රජු:** තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනාව, වේළුවනාරාම පූජාව, රාජ භටයන් පැවිදි නොකළ යුතු බවට කළ ඉල්ලීම පිළිගැනීම, උපෝසථ කර්මය අනුමත කිරීම, අදත්තාදාන පාරාජිකාව පැනවීම ආදී කරුණු බිම්බිසාර රජු හා බුදුරදුන් අතර සමීප සබඳතා පැවති බව තහවුරු කිරීම
- **මගධාධිපති අජාසත් රජු:** සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කිරීම, සුනීධ, වස්සකාර ඇමතිවරුන් උපදෙස් ලබා ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ වෙත යොමු කරවීම ආදී කරුණු අජාසත් රජු හා බුදුරජාණන් වහන්සේ අතර සමීප සබඳතා පැවති බව තහවුරු කිරීම
- **කෝසලාධිපති පසේනදී කොසොල් රජු:** කොසොල් රජු අරබයා කෝසල සංයුත්තයේ සූත්‍ර විසිපහෙන් සූත්‍ර රාශියක් දේශනා කිරීම, රජුගේ පෞද්ගලික ප්‍රශ්න විසඳාගැනීමට පවා බුදුරජාණන් වහන්සේ පිහිට වීම, කරුණු පහකින් බුදුරජාණන් වහන්සේ හා තමා සමාන බව කොසොල් රජු විසින් ප්‍රකාශ කරනු ලැබීම
- ජේතවනාරාම භූමිය තුළ රාජිකාරාමය තනවා පූජා කිරීම
- ජේතවනාරාමයේ වස් 19ක් සහ පූර්වාරාමයේ වස් 6ක් වශයෙන් බුදුරදුන් වැඩිම වාර ගණනක් කෝසල රාජ්‍යයේ වස් විසීම, බුදුසසුනේ ප්‍රධාන දායකයා වූ අනේපිඩු සිටුතුමා සහ ප්‍රධාන දායිකාව වූ විශාඛාව කෝසලයේ වාසය කිරීම, ජේතවනාරාමය, පූර්වාරාමය ආදී ආරාම පිහිටීම, අංගුලිමාල දමනය ආදි ශාසන ඉතිහාසයට අදාළ ප්‍රධානතම සිදුවීම්,
- වජ්ජි ජනපදයේ කූටාගාර ශාලාවේ පස්වෙනි වස්කාලය ගත කිරීම හා එහිදී ප්‍රජාපතී ගෝතමිය ඇතුළු ශාක්‍ය කුමාරිකාවන් පන්සියයක් පැවිදි කිරීමෙන් භික්ෂුණී ශාසනය පිහිටුවීම
- **වජ්ජි රාජ්‍යය:** වජ්ජි රාජ්‍යයේ පාලන මූලධර්මය ලෙස අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම දේශනා කිරීම හා වජ්ජීන්ගේ සමූහාණ්ඩු පාලන ක්‍රමය බුදුරදුන්ගේ ඇගයීමට ලක්වීම. බුදුරජාණන් වහන්සේ අන්තිම වස්කාලය වජ්ජි ජනපදයේ බේලුව නම් ගමෙහි ගත කිරීම, බුදුසිරුර ආදාහනයෙන් අනතුරුව වජ්ජීන් වෙනුවෙන් ද ශාරීරික ධාතු වෙන්කිරීම හා වජ්ජි රජවරුන් ධාතු පිළිගෙන චෛත්‍යයක් ඉදි කිරීම ආදී කරුණු වජ්ජි පාලකයන් හා බුදුරදුන් අතර සමීප සබඳතා පැවති බව තහවුරු කිරීම

**(නිදසුන් පහක් ඇසුරින් දක්වීම ප්‍රමාණවත්ය.)**

**(ලකුණු 05 යි)**



Department of Examinations - Sri Lanka

**01. (v) පූරණ කස්සපගේ අකිරියවාදී දර්ශනය සැකෙවින් හඳුන්වා, එය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විමසීමට ලක් කරන්න.**

**පූරණ කස්සපගේ අකිරියවාදී දර්ශනය**

- පූරණ කස්සප අකිරියවාදියෙක් ලෙස දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් වේ.
- සියතින් කරන්නාට ද, අනුන් ලවා කරවන්නාට ද, අනුන්ගේ අත්පා සිඳින්නාට ද සිඳුවන්නාට ද, අනුන් දඬුවම් ආදියෙන් පෙළන්නාට ද, පවක් සිදු නොවන බව පූරණ කස්සපගේ අකිරියවාදී දර්ශනයෙන් දක්වා ඇත. සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැතැයි ඉගන්වූ ඔහු ගංගා නම් ගඟේ දකුණු කෙළවර දක්වා ගමන් කරමින් හමුවන සියලුම ප්‍රාණීන් මරමින්, මරවමින්, සිඳමින්, සිඳුවමින් ගමන් කළ ද එයින් සිදුවන පවක් නැතැයි ද ප්‍රකාශ කළහ.

  ''කරෝතෝ ඛෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ ඡේදාපයතෝ පචතෝ පාචයතෝ... ඛුරපරියන්තේන චේපි චක්කේන යො ඉමිස්සා පඨවියා පාණෙ ඒකමංසඛලං ඒකමංසපුඤ්ජං කරෙය්‍ය නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ. දක්ඛිණං චේපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තෝ ඝාතෙන්තෝ ඡින්දන්තෝ ඡේදාපෙන්තෝ පචෙන්තෝ පාචෙන්තෝ නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ...........''

- දන්දෙමින්, දෙවමින්, යාග කරමින්, කරවමින්, ගංගා නම් ගඟේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමුදු පිනක් හෝ පිනක පැමිණීමක් ද නැත. දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන් සිදුවන පිනක් හෝ පිනක පැමිණීමක් ද නැත.

  ''උත්තරං චෙපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තෝ දාපෙන්තෝ යජන්තෝ යජාපෙන්තෝ නත්ථි තතෝ නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමෝ. දානේන දමේන සංයමේන සච්චවජ්ජේන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ........''

**අකිරියවාදය පිළිබඳ බෞද්ධ විචාරය**

- අකිරියවාදය ප්‍රතික්ෂේප කරන බුදුදහම කිරියවාදී, විරියවාදී, කම්මවාදී දහමක් ඉදිරිපත් කරන අතර එමගින් කර්ම විපාක සිද්ධාන්තය බුදුසමයේ මූලික ඉගැන්වීමක් ලෙස පිළිගන්නා බව
- බුදුදහම සචේතනික ක්‍රියාවේ වගකීම කරන්නා විසින් ම දැරිය යුතු යැයි ඉගැන්වීම

  "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
  අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති..." - ධම්මපදය
- අංගුත්තරනිකායේ නිබ්බේධික සූත්‍රයට අනුව

  ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති. කායේන වාචාය මනසා''
  "මහණෙනි, මම චේතානව කර්මය යැයි කියමි. කයින්, වචනයෙන්, සිතා කර්ම කරයි." හිතා මතා තිදොරින් කරනු ලබන ක්‍රියා කර්ම වන බව මෙයින් තහවුරු වීම
- ලෝභ, දෝස, මෝහ චේතනා පෙරදැරිව සිදුකරන ක්‍රියා අකුශල ක්‍රියා වන අතර, අලෝභ, අදෝස, අමෝහ චේතනා පෙරදැරිව සිදු කරනු ලබන ක්‍රියා කුශල ක්‍රියා වීම
- සචේතනිකව සිදු කරනු ලබන පින්-පව්, කුසල්-අකුසල් අදාළ පුද්ගලයාට දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය වශයෙන් මෙලොවදී හෝ මතු භවවලදී හෝ විපාක ලබා දීමට ඉදිරිපත් වන බව

Department of Examinations - Sri Lanka

- ප්‍රාණඝාතාදී සියලු දුසිරිත් අසාධු, අකරණීය, පාප, අකුසල ලෙස හඳුන්වා ඒවායින් වැළකෙන ලෙස උපදෙස් දෙන බුදුසමය තමාට, මෙරමාට හා උභය පක්ෂයට හිතසුව පිණිස පවතින දානාදී සත් ක්‍රියා සාධු, පුඤ්ඤ, කුසල ලෙස ඉහළින් අගය කරන බව
- දානය, ඉන්ද්‍රිය දමනය, සීල සංවරය ආදී ක්‍රියා මෙලොව පරලොව ජීවිත සුවපත් කිරීමට පමණක් නොව සාංසාරික දුක් කෙළවර කොට නිවන් පසක් කිරීමට ද ඉවහල් වන මහානිසංසදායක සදාචාරාත්මක සත් ක්‍රියා ලෙස බුදුදහම අගය කරන බව
- චුල්ලකම්මවිභංග සූත්‍රයට අනුව සත්ත්වයා වෙනස්කම් සහිතව උපදින්නේ කර්මය හේතුවෙන් බව

මෙබඳු කරුණු ඇසුරින් අකිරියවාදය සැකෙවින් හඳුන්වා ඒ පිළිබඳ බෞද්ධ විග්‍රහය දැක්වීම ප්‍රමාණවත් වේ.

(ලකුණු 06 යි)

**02. (i) බුදුරජාණන් වහන්සේ "සුගත" නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න.**

- කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය යන අන්ත ද්වයට නො පැමිණ මධ්‍යම ප්‍රතිපදා ආර්ය මාර්ගයේ ගමන් කළ හෙයින්,
- සුන්දර වූ නිවනට සැපත් වූ බැවින්
- සුදුසු තැන සුදුසු වචන යහපත්ව කතා කරන බැවින්

| | |
|---|---|
| යහපත් කොට | යෙතැයි |
| සුන්දර තැනට | සැපතැයි |
| සොඳුරු බස් | කියතැයි |
| කියති ඒ මුනි රජුට | සුගතැයි |

(ලකුණු 02 යි)

**02 (ii) බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය ප්‍රකට වන අවස්ථා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

- නිශ්චිත අරමුණක් කරා තම අනුගාමිකයන් නිසි ලෙස මෙහෙයවන්නා, හික්මවන්නා නායකයා ය.
- බුද්ධ චරිතයෙන් ප්‍රකට වන ආදර්ශවත් නායකත්ව ගුණාංග;
  - -මහාකරුණා, මහාප්‍රඥා ගුණවලින් කටයුතු කිරීම
  - -අන්තගාමී නො වීම
  - -මැදහත් පිළිවෙත අනුගමනය කිරීම
  - -දේශනා කෞශල්‍ය හා උපාය කෞශල්‍ය ඥාණ
  - -ආදර්ශ සම්පන්න වීම
  - -යථාවාදී තථාකාරී සහ යථාකාරී තථාවාදී වීම
  - -පිරිසිදු චරිතයකින් යුක්ත වීම
  - -විමසීමට, ප්‍රශ්න කිරීමට ඉඩ දීම
  - -අනුගාමිකයින්ගේ සුව පහසුව ගැන සොයා බැලීම
  - -අභියෝගයන්ට නො සැලී මුහුණ දීම



Department of Examinations - Sri Lanka

-අනුගාමිකයින්ගේ දක්ෂතා හා ප්‍රවීණතා නිසි ලෙස හැඳින ගෙන ඒවා අගය කිරීම

-සුදුස්සාට සුදුසු වගකීම් පැවරීම

-නම්‍යශීලීත්වය

- විවෘත සහ ඍජු පිළිවෙත

**බුද්ධචරිතයෙන් මූර්තිමත් වන මෙවැනි ආදර්ශවත් නායකත්ව ගුණාංග ප්‍රකට වන අවස්ථා තුනක් පැහැදිලි කර තිබිය යුතු ය.**

**(ලකුණු 03 යි)**

2 **(iii) බුදුරජාණන් වහන්සේගේ ආගමික සහනශීලී ගුණය උදාහරණ හතරක් ඇසුරින් ප්‍රකට කරන්න.**

- උපාලි සූත්‍රයේදී උපාලි ගෘහපතියා අමතා කරන ලද ප්‍රකාශයෙන් ද ආගමික සහනශීලීත්වය ප්‍රකට වේ. ජෛන භක්තික උපාලි ගෘහපති වාදයක් සඳහා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වාදයෙන් පැරදී උන්වහන්සේ පිළිබඳ ප්‍රසාදයෙන් තමා තෙරුවන් සරණ ගිය උපාසකයකු කොට දරන්න යැයි ඉල්ලූ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඉක්මන් තීරණ නො ගෙන තව දුරටත් සිතා බලන ලෙසත් පෙර ශාස්තෘවරයාට කළ පුද සත්කාර එලෙසම පවත්වා ගෙන යන ලෙසත්ය.
- මහාවග්ගපාළියට අනුව සීහ සේනාපතියා හා බුදුරජාණන් වහන්සේ අතර සිදුවූ සාකච්ඡාවෙන් අනතුරුව සීහ සෙනාපතියා බුදුන් සරණ යාමට අවසර ඉල්ලූවිට '' සීහය, ඔබ වැනි කෙනෙකු එසේ කිරීම සුදුසු නොවේ. නැවත නැවතත් සිතා බලා සරණ යාම ඔබ වැනි කෙනෙකුට සුදුසුය" යනුවෙන් කළ ප්‍රකාශය
- උදුම්බරික සීහනාද සූත්‍රයෙහි අන්තර්ගත නිග්‍රෝධ පිරිවැජියා අමතා ''නිග්‍රෝධය, නුඹට මෙබඳු අදහසක් වන්නේය. අප අතවැස්සන් කරනු කැමැත්තෙන් ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කියන්නේය, කියාය. නිග්‍රෝධය මේ කාරණය එසේ නො දතයුතු. යමෙක් ඔබගේ ගුරු වේ ද ඔහු ම ඔබගේ ගුරු වේවා.... හිත කෙලෙසෙන්නා වූ නැවත ඉපදීම ඇති කරන්නා වූ දැවීම් සහිත වූ දුක් විපාක ඇත්තා වූ මත්තෙහි ජාති ජරා මරණ උපදවන්නා වූ අකුසල ධර්මයන්ගේ දුරු කිරීම පිණිස ධර්මය දේශනා කරමි, යනුවෙන් දේශනා කර ඇත.
- දානය පිළිබඳ දක්වා ඇති බොහෝ තැන්වලදී ''මහණ බමුණන්ට දන්දීම'' යනුවෙන් සඳහන් ව ඇති බැවින් තත්කාලීන සියලු ආගමික පූජ්‍ය පූජකයන් අරමුණු කොට ඇතිබව පැහැදිලිය.
- පොට්ඨපාද සූත්‍රයේ දැක්වෙන පරිදි පොට්ඨපාද පිරිවැජියා ඈත වඩින බුදුන්වහන්සේ දැක උන්වහන්සේගේ පැමිණීම අපේක්ෂාවෙන් තුන් දහසක් තරම් වූ තම පිරිවැජි පිරිස අමතා '' භවත්හු නිහඬ වෙත්වා, ඒ මහණ ගොයුම්හු එයි. ඒ ආයුෂ්මත් තෙම නිහඬ බව කැමැත්තේය. නිහඬ බැව්හි ගුණ කියන සුළුය.'' යනුවෙන් ප්‍රකාශ කර ඇත.
- මහා සකුළුදායි සූත්‍රයේ සඳහන් වන පරිදි සකුළුදායි පිරිවැජියා තම පරිබ්‍රාජක අසපුවට වැඩි බුදුරජාණන් වහන්සේ ඉතා ප්‍රසාදයෙන් සුහදව පිළිගෙන'' ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩින සේක්වා, භාග්‍යවතුන් වහන්සේගේ වැඩීම යහපති. භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි වැඩම කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳින සේක්වා...'' යනුවෙන් ප්‍රකාශ කොට ඇත.



Department of Examinations - Sri Lanka

- තව ද බුදුරජාණන් වහන්සේ සමකාලීන අන්‍යාගමික ශාස්තෘන්ගේ පවා බුහුමනට පාත්‍ර වූයේ උන්වහන්සේ සතු ආගමික සහනශීලීතාව හේතුවෙන් බව සෝණදණ්ඩ හා චංකී වැනි සූත්‍රවලින් හෙළි වේ.

**(ලකුණු 04 යි)**

2 **(iv) විශාඛා මහෝපාසිකාවගේ චරිත කථාව ඇසුරින් ගිහි ජීවිතයක සාර්ථකත්වය සඳහා ලබා ගත හැකි ආදර්ශ පහක් පෙන්වා දෙන්න.**

- ආගමික ලැදියාව
  තමා සන්තකව තිබූ මහාමේල පලඳනාව නම් ආභරණය අලෙවි කොට පූර්වාරාමය තනා සඟසතු කොට පූජා කිරීම
  දිනපතා බුදුරදුන් වැඩ සිටි විහාරයට ගොස් උන්වහන්සේ ඇතුළු භික්ෂු සංඝයා වැඳ පුදා ගැනීම.
  නිබඳවම බුදුරදුන්ටත් භික්ෂූන් වහන්සේලාටත් භික්ෂුණීන් වහන්සේලාටත් නාන සළු, ආගන්තුක බත, ගමික බත, උවටැන් බත, බෙහෙත් කැඳ ආදියෙන් උවටැන් කිරීම.
- අවවාද අනුශාසනා පිළිගැනීම
  පති කුලයට යනවිට පියාණන් විසින් ලබා දුන් අවවාද දහය පිළිපැදීම
- තමා වෙත ලැබුණු වගකීම් නො පිරිහෙලා ඉටු කිරීම
  කුමාර කාශ්‍යප මාතාව පිළිබඳ ගැටලුව විසඳීමට බුදුරදුන් විසින් ඇය පත් කරනු ලැබූ කල්හි එය මැනවින් ඉටු කිරීම
- ඥාති මිත්‍රාදීන් බුදු දහමෙහි පහදවා ලීම
  පෙර ජෛන දහම ඇදහූ සිය මාමණ්ඩිය වූ මිගාර සිටුතුමා බුදු දහමෙහි පහදවා ලීම.
- ඉවසීමේ ගුණය
  මිගාර සිටු කොතෙක් කෙණෙහිලිකම් කළ ද ඉවසීමෙන් දරා සිටීම
- නිර්ලෝභීත්වය
  මහාමේල පළඳනාව මිල දී ගැනීමට කෙනෙක් නො සිටිය ද එය තමාම මිල දී ගෙන ඊට නියමිත මුදලින් පූර්වාරාමය කරවීම.
- අනතිමානිත්වයෙන් යුක්ත වීම
  පංචකල්‍යාණියෙන් යුතු වුව ද සියළු සැප සම්පතින් ආඪ්‍ය වුව ද මානයෙන් උදම් නොවීම.
- කළමනාකරණය
  මිගාරමාතු ප්‍රාසාදයේ වැඩ නිමවන තෙක් මුගලන් හිමියන් සමග එහි කටයුතු අධීක්ෂණය කිරීම

**(ලකුණු 05 යි)**

2 **(v) වර්තමාන සමාජ ගැටලු අවම කර ගැනීමෙහිලා පංචසීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල විස්තර කරන්න.**

- බෞද්ධයාගේ නිත්‍ය ශීලය වන පංචශීල ප්‍රතිපදාව ජාති ආගම් භේදයකින් තොරව සමාජ ගැටලු අවම කර ගැනීමෙහිලා ඉවහල් වන ආචාර ධර්ම පද්ධතියකි. එහි විරති පක්ෂය සපිරීමෙන් ආධ්‍යාත්මික කුශල ශක්තිය වැඩෙන අතර සමාදාන පක්ෂය අනුගමනය කිරීමෙන් යුතුකම් ඉටුකරන, සමාජයේ සියලු දෙනා කෙරෙහි බැඳුණු සාමකාමී සමාජයක් බිහි වේ.



Department of Examinations - Sri Lanka

- ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් සියලු සතුන්ට දයාවන්ත වන අතර තමාගේ මෙන් ම මෙරමාගේ ජීවත් වීමේ අයිතිය සුරකෙන සමාජයක් බිහි වේ.
- අදත්තාදානයෙන් වැළකීමෙන් තමාගේ දේපල සුරක්ෂිත වන අතර වංචාව සොරකම අල්ලස, පොදුසම්පත් අවභාවිතය වැනි දුසිරිත් නොකරන යහපත් සමාජයක් බිහි වේ.
- කාමමිථ්‍යාචාරයෙන් වෙන් වීමෙන් තමාගේ මෙන් ම අනුන්ගේ පවුල් ජීවිත සුරක්ෂිත වන අතර බාලාපචාර, ස්ත්‍රී දූෂණ, ගණිකා වෘත්තිය වැනි දුසිරිත්වලින් තොර කාන්තා ගෞරවය සුරකින සමාජයක් ගොඩ නැගේ.
- මුසාවාදයෙන් වෙන්වීමෙන් සමාජයේ තුළ සියලු දෙනාට සත්‍ය දැන ගැනීමට හා වංචනිකයන්ට නො රැවටී විශ්වසනීය පුද්ගලයන්ගෙන් හෙබි සමාජයක ජීවත් වීමට අවස්ථාව උදාවේ.
- සුරාව, මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිතය, බොහෝ ගැටුම් හා සමාජ අසහනකාරී තත්ත්වයන් නිර්මාණය කරයි. ඉන් වැළකීමෙන් මානසික අසහනය හා තැන්පත් මනසකින් යුතු නීති විරෝධී ක්‍රියා නො කරන මිනිසුන්ගෙන් හෙබි සාමකාමී සමාජ වටපිටාවක් ගොඩ නැගේ.

(ලකුණු 06 යි)

**3 (i) "ජයං වේරං පසවති" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.**

ජයං වේරං පසවති දුක්ඛං සේති පරාජිතෝ
උපසන්තෝ සුඛං සේති හිත්වා ජයපරාජයං

(ලකුණු 02 යි)

**3 (II) ඉහත (i) හි සඳහන් කරන ලද ගාථාවේ අර්ථය ලියා දක්වන්න.**

දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පරදින්නා දුක සේ වෙසේ. (රාගාදි කෙලෙසුන් කෙරෙන් මිදුණු) උපශාන්තයා ජයත් පරාජයත් හැර සුවසේ වෙසේ.

(ලකුණු 03 යි)

**3 (III) ගුරු-ශිෂ්‍ය යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න.**

**ගුරුවරයා විසින් ශිෂ්‍යයා වෙත**

සුවිනීතං විනෙන්ති - මනාව හික්ම වීම
සුග්ගහිතං ගාහාපෙන්ති - මනා කොට ඉගැන්වීම
සබ්බසිප්පසුතං සමක්ඛායිනෝ භවන්ති - දත් සියලු ශිල්ප ඉගැන්වීම
මිත්තාමච්චේසු පටියාදෙන්ති - හිත මිතුරන්ට හඳුන්වා දීම
දිසාසු පරිත්තානං කරොන්ති - හැම කල්හිම ආරක්ෂාව සැලසීම

**ශිෂ්‍යයන් විසින් ගුරුවරුන් වෙත**

උට්ඨානේන - දැක නැගී සිටීම
උපට්ඨානේන - උපස්ථාන කිරීම
සුස්සූසාය - මනාව අසා සිටීම
පාරිචරියාය - මෙහෙවර කිරීම
සක්කච්චං සිප්ප පටිග්ගහනේන - සකසා ශිල්ප ඉගෙනීම

(ලකුණු 04 යි)



Department of Examinations - Sri Lanka

**3 (IV) ගිහි ජීවිතයක පරිහානියට බලපාන හේතු වළක්වා ගැනීමෙන් දියුණුව උදාකර ගත හැකි බව පරාභව සූත්‍රාගත සාධක පහක් ඇසුරින් පැහැදිලි කරන්න**

- බුද්දකනිකායේ සුත්තනිපාතයේ උරග වග්ගයේ හයවන සූත්‍රය වන පරාභව සූත්‍රයේ පිරිහීමට හේතු වන කරුණු විසිඑකක් දක්වා තිබේ.

1. දහමට ද්වේෂ කිරීම
2. අසත් පුරුෂයන්ට ප්‍රිය වීම
3. සත්පුරුෂයන්ට ප්‍රිය නොවීම
4. අසත්පුරුෂ ධර්මයට ප්‍රිය වීම
5. නිතර නිදන සුළු බව
6. දොඩමලුව පිරිස සමග කාලය ගත කිරීම
7. උට්ඨාන වීර්යයෙන් තොර වීම
8. අලසකමින් යුක්ත වීම
9. ක්‍රෝධ බහුල වීම
10. හැකියාව තිබියදීත් මහළු දෙමාපියන් පෝෂණය නොකිරීම
11. මහණ බමුණන් හෝ යාචකයන් බොරුවෙන් රැවටීම
12. බොහෝ සම්පත් ඇති පුද්ගලයෙක් ඒවා තනිව භුක්ති විඳීම
13. ජාතිය, ගෝත්‍රය, ධනය ආදිය පිළිබඳ මානයෙන් යුක්තව ස්වකීය ඥාතීන් පහත් කොට සැලකීම
14. ස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම
15. සුරාවට ලොල් වීම
16. සූදුවට ලොල් වීම
17. සිය බිරිඳගෙන් සතුටු නොවී වෛශ්‍යාවන් කරා යාම
18. පරඹුවන් කරා යාම
19. මහලු වියේ සිටින අයෙක් නව යොවුන් තරුණියක සරණ පාවා ගෙන ඇය කෙරෙහි ඊර්ෂාවෙන් නොනිදා සිටීම
20. රසයෙහි ගිජු දුරාචාරයට ලොල්වූ කාන්තාවක හෝ පුරුෂයකු ප්‍රධානත්වයෙහි තැබීම
21. ක්ෂත්‍රිය කුලයක ඉපිද දිළින්දෙකු ව සිටිමින් තෘෂ්ණාවෙන් රජකම ප්‍රාර්ථනා කිරීම

**(ලකුණු 05 යි)**

**3 (V) සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආර්ථික සුරක්ෂිතතාව පිණිස ඉවහල් වන ආකාරය විස්තර කරන්න.**

- භෞතික සම්පත් ඵලදායි ලෙස යොදා ගැනීම පිණිස කළමනාකරණය අත්‍යවශ්‍ය සාධකයක් වන බව
- සම්පත් නිසි පරිදි කළමනාකරණය කර ගැනීම ගෘහස්ථ ජීවිතයේ දියුණුවට අත්‍යවශ්‍ය සාධකයක් බව
- සිගාලෝවාද සූත්‍රය, කුල සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ආදි දේශනාවන්හි භෞතික සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රායෝගික උපදෙස් ඇතුළත් වනබව

Department of Examinations - Sri Lanka

- **සමජීවිකතාව**

" මේ ලෝකයෙහි කුලපුත්‍රයෙක් භෝගයන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නො කොට ඉතා අඩුත් නො කොට සමව දිවි ගෙවයි ද මෙසේ මාගේ අය වැය ඉක්මවා සිටී. මෙසේ මාගේ අය වැය ඉක්මවා නො සිටී" යනුවෙන් අවබෝධයෙන් කටයුතු කිරීම. (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය - අංගුත්තරනිකාය)

- භෞතික සම්පත් කළමනාකරණයේදී උපයන ධනය නිවැරදි ලෙස පාලනය කිරීම ඉතා වැදගත්ය.

උදුම්බරඛාදික - අධිපරිභෝජනය

අජද්ධුමාරික - පරිභෝජනයෙන් තොරව එක් රැස් කිරීම

ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ

චතුත්ථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති (සිගාලෝවාද සූත්‍රය - දීඝනිකාය)

- දීඝනිකායේ සිගාලෝවාද සූත්‍රයේ භෝග විනාශ මුඛ හයක් දක්වා තිබේ.
  1. මත් බවට ප්‍රමාදයට හේතු වූ රහමෙර පානයෙහි ඇබ්බැහි වීම
  2. අවේලාවේ වීථි සංචාරය
  3. සමජ්ජාභිචරණය (නැටුම්, ගැයුම්, උත්සව, සන්දර්ශන ආදියෙහි ඇලීම)
  4. දූකෙලියෙහි ඇලීම
  5. පාපමිත්‍ර සේවනය
  6. අලසකම (සිගාලෝවාද සූත්‍රය - දීඝනිකාය)

- අංගුත්තරනිකායේ කුල සූත්‍රයෙහි සම්පත් නාස්තියෙන් තොරව උපරිම ප්‍රයෝජන පිණිස යෙදවිය යුතු බව දක්වා තිබේ.
  1. නැසුණු සම්පත් උපයා තැබිය යුතු ය.
  2. දිරා විනාශ වන සම්පත් ප්‍රතිසංස්කරණය කළ යුතු ය.
  3. අයවැය ප්‍රමාණය දැන පරිභෝජනය කළ යුතු ය.
  4. සිල්වත් වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු වී අය වැය කළමනාකරණය කළ යුතු ය.

- ස්වාමි- භාර්යා යුතුකම් දක්වන විට ගෘහ කටයුතු මැනවින් සංවිධානය කිරීම (සුසංවිහිත කම්මන්තා හෝති) සහ ස්වාමියා උපයන ධනය ආරක්ෂා කිරීම (සම්භතං අනුරක්ඛති) යනාදී කරුණු කළමනාකරණයට අදාළ වීම

**(ලකුණු 06 යි)**

**4. (i) උපත පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා උසස්-පහත් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව බෞද්ධ මූලාශ්‍රය සාධක ඇසුරින් පහදන්න.**

- ජන්මීය සාධක පදනම් කරගෙන මිනිස් වර්ගයා උසස් පහත් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව ඓතිහාසික, ජීවවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක, ආචාරවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ආදී සාධක තුළින් බුදුසමය අවධාරණය කොට තිබීම
- දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය ඓතිහාසිකව, පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අනුව පරිණාමය වූවක් බව පෙන්වා දීම
- උපත පදනම් කරගෙන මිනිස් වර්ගයා උස් පහත් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව වාසෙට්ඨ සූත්‍රයේ දී ජීවවිද්‍යාත්මක පදනමකින් පැහැදිලි කර ඇති බව
- බමුණෙකු හෝ අබ්‍රාහ්මණයෙකු වන්නේ ක්‍රියාවෙන් බව වාසෙට්ඨ හා භාරද්වාජ යන බමුණන්ට බුදුරජාණන් වහන්සේ විසින් මජ්ඣිමනිකායේ වාසෙට්ඨ සූත්‍රයේ දී දක්වා ඇති බව.

Department of Examinations - Sri Lanka

- මජ්ඣිමනිකායේ අස්සලායන සූත්‍රයේදී අස්සලායන බමුණා විසින් බුදුරදුන් හමුවේ බමුණන්ගේ ශ්‍රේෂ්ඨත්වය, පාරිශුද්ධිය වර්ණනා කරන ලද අවස්ථාවේදී අනෙක් මිනිසුන්ගේ උපත සිදුවන ආකාරයටම බමුණු ස්ත්‍රීන් ඍතුවීම, ගැබ් ගැනීම, දරුවන් වැදීම, කිරි පෙවීම ආදිය පෙනි පෙනී තිබියදී ම බමුණන් මහාබ්‍රහ්මයාගේ මුඛයෙන් උපන් බව පැවසීම අර්ථ ශූන්‍ය බව පෙන්වා දීම

- දීඝනිකායේ අම්බට්ඨ සූත්‍රයේ දී බමුණන් අතිමානයෙන් සැලකූ කුල පාරිශුද්ධිය ද මිථ්‍යා විශ්වාසයක් බව පැහැදිලි කිරීම

- මජ්ඣිමනිකායේ මධුර සූත්‍රයේ දී මිනිසුන් අතර ජාති හෝ වර්ණ භේදය නොපැවතිය යුතු බව ආර්ථික හා සමාජවිද්‍යාත්මක පදනමකින් යුතුව කරුණු දක්වා තිබීම

- මජ්ඣිමනිකායේ අස්සලායන සූත්‍රයේ යෝන කාම්බෝජ ආදී ඇතැම් ප්‍රදේශයන්හි ආර්යයන් දාසයන් වන බවත් දාසයන් ආර්යයන් වන බවත් පෙන්වා දීම

- මජ්ඣිමනිකායේ මධුර සූත්‍රයේ දී වර්ණ භේදයකින් තොරව කර්ම ඵල විපාක සියල්ලන්ටම එක සේ ලැබෙන බව

- සුත්තනිපාතයේ වසල සූත්‍රයේ දී පුද්ගලයෙකුගේ හොඳ නරක තීරණය වන්නේ ඔහුගේ ක්‍රියාවෙන් මිස උපතින් නොවන බව

මෙම සාධක අනුව උපත පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා උසස් පහත් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව පෙන්වා දිය යුතුය.

**(ලකුණු 10 යි)**

**4. (ii) "ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව සැලසීම රජුගේ ප්‍රධාන වගකීමකි." බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම ඇසුරින් විමසන්න.**

- පාලකයා ධර්මයට අනුව රට පාලනය කරන දැහැමි පුද්ගලයකු විය යුතුය යන්න බුදුසමයේ මූලික පිළිගැනීම බව
- දැහැමි සමාජයක් උදෙසා මෙන්ම ජනතාවට දැහැමි රැකවරණය හා ආර්ථික සුරක්ෂිතතාව සැලසීම උදෙසා පළමුව පාලකයා දැහැමි විය යුතු බව
- බොහෝ පාලි සූත්‍ර දේශනාවන්හි ධම්මිකෝ ධම්මරාජා යන ප්‍රයෝගය දක්නට ලැබීම
- රජු අදැහැමි වූ කල්හි ඇති ඇමැතීන් මෙන්ම රට වැසියා ද අධාර්මික වේ. කලට වැසි නොවැසීම ආදි ස්වාභාවික විපත් සිදුවී රාජ්‍ය බිඳ වැටෙන බව අධම්මික සූත්‍රයේ දැක්වෙන බව.
- ජනතාවට දැහැමි රැකවරණය සැලසීමටත් ජනතාවගේ ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමටත් රජයේ මැදිහත් වීම දීඝනිකායේ කූටදන්ත සූත්‍රයෙන් අවධාරණය කොට තිබීම.
- දසසක්විතිවත්, දශරාජධර්ම, සතර සංග්‍රහවස්තු, සප්ත අපරිහානියධර්ම, පංචසීල ප්‍රතිපදාව, සතර අගතියෙන් තොරව කටයුතු කිරීම ආදිය ජනතාවට දැහැමි රැකවරණය සලසමින් දැහැමි සමාජයක් ගොඩනැගීමේ බෞද්ධ දේශපාලන ප්‍රතිපත්ති බව
- කූටදන්ත සූත්‍රයේ දැක්වෙන ජනතාවගේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් පාලකයා විසින් ඉටුකළ යුතු යුතුකම්
  - කෘෂිකර්මාන්තයෙහි නියුතු වන්නන්ට පොහොර, බීජ, ආදිය ලබා දීම
  - රාජ්‍ය සේවකයින්ට බත් වැටුප් ලබාදීම
  - වෙළෙන්දන්ට ප්‍රාග්ධන පහසුකම් ලබාදීම
  - ආර්ථික අපහසුතා ඇති අවස්ථාවලදී බදුසහන ලබාදීම
  - ආර්ථික පරිහාණියට හේතුවන ඇතැම් ක්‍රියාවලින් වැළකීම
- දසසක්විතිවත්වල දිළින්දන්ට ධනය දීම
- සතර සංග්‍රහවස්තූන්හි සඳහන් වන අර්ථ චර්යාව මගින් රටක සමෘද්ධිය ඇති කරවීම
- දශරාජධර්මවල එන දානය පරිත්‍යාගය වැනි පිළිවෙත් අනුගමනය කිරීමෙන් ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීම

**(ලකුණු 10 යි)**

Department of Examinations - Sri Lanka

### 5 (i) බුද්ධකාලීන ධර්මදූත සේවාවේ සාර්ථකත්වය සඳහා බලපෑ හේතු සාධක පරීක්ෂාකරන්න

බුද්ධකාලීන ධර්මදූත සේවාව ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ.
බුදුරජාණන් වහන්සේගේ ධර්මදූත සේවය

ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධර්මදූත සේවය

**ධර්මදූත සේවාවේ සාර්ථකත්වයට බලපෑ හේතු**

1. බුදුරජාණන් වහන්සේගේ නායකත්වය
2. ධර්මයේ සුවිශේෂතාව
3. ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ කැපවීම
4. වෙනත් සාධක

**බුදුරජාණන් වහන්සේගේ නායකත්වය**

- බුදුරජාණන් වහන්සේ සතුව පැවති බාහිර පෞරුෂය
- මහාකරුණාව, මහාප්‍රඥාව, නව අරහාදී බුදුගුණ ආදී අභ්‍යන්තර පෞරුෂීය සාධක
- පළමු කොට අවබෝධකර ගත හැකි පිරිසකට දහම් දෙසීම
- පළමු කොට අවබෝධකර ගත හැකි පිරිසකට දහම් දෙසීම
- ප්‍රථම ධර්මදූත සේවා කණ්ඩායම නිවැරදිව ඒ සඳහා යෙදවීම

"චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය.... අත්ථාය හිතාය...." යන පාඨයට "අනුව බොහෝ ජනයාගේ හිත පිණිස, සුව පිණිස සදහම් චාරිකාවේ හැසිරෙන ලෙසත්, මුල මැද අග කළණ වූ දහම් දෙසන ලෙසත්, දෙදෙනෙකු එක මග නොයන ලෙසත්" උපදෙස් ලබාදීම.

- ධර්මදූත පිරිස ධර්ම ප්‍රචාරක සේවයේ යොදවා බුදුරජාණන් වහන්සේ ද ධර්ම ප්‍රචාරක සේවයේ නිරත වීම.
- බුදුරජාණන් වහන්සේ විශිෂ්ට දේශනා කෞශල්‍යකින් යුතුවීම (දේශනාක්‍රම භාවිතා කිරීම, අවබෝධ කරවීමේ ක්‍රම භාවිතා කිරීම, උපමා භාවිතය, දෘශ්‍යාධාර භාවිතාකරමින් දහම් දෙසීම ආදී)
- පරාර්ථය උදෙසා කැපවීම
    - දවස කොටස් පහකට බෙදාගෙන උපරිම සේවයක් සැළසීම
    - තුරිත (සෘද්ධියෙන් වැඩීම) අතුරිත (පාගමනින් වැඩීම)
- සමානාත්මතා ධර්මයෙන් යුක්තවීම
- සිවු කුලය වෙනුවට සිව්වනක් පිරිසක් නිර්මාණය කිරීම
- සිවු කුලයේම අයට පැවිදි වීමට අවස්ථාව ලබා දීම හා පැවිදි වූ සැවොම ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ නාමයෙන් හැඳින්වීම

**ධර්මයේ සුවිශේෂීතාව**

- යථාර්ථවාදී ප්‍රායෝගික දහමක් වීම
- චින්තන හා වීමංසන නිදහස ලබා දීම.

**ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ කැපවීම**

- වඩාත් සංවිධානාත්මකව, ප්‍රජානුකම්පාවෙන් යුතුව, දුෂ්කරතා විඳදරා ගනිමින්, කැපවීමෙන් ධර්මය ප්‍රචාරය කිරීමට ශ්‍රාවික ශ්‍රාවිකාවන් කටයුතු කළ බව

- සැරියුත්, මුගලන්, ආනන්ද, පුණ්ණමන්තාණි පුත්ත, මහාකාශ්‍යප, සුනාපරන්තවාසි පුණ්ණ, මහාකච්චායන, කොණ්ඩඤ්ඤ, අස්සජි ආදි ධර්මධර, විනයධර, ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයින් ද

- ප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, සේලා, වජිරා, සෝමා වැනි භික්ෂුනීන් වහන්සේලා ද ධර්මදූත සේවාවේදී ප්‍රශස්ත කාර්යයභාරයක් ඉටුකිරීම

Department of Examinations - Sri Lanka

**වෙනත් සාධක**

- රජවරුන්ගේ, සිටුවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලැබීම
- කාන්තා ප්‍රජාවගේ දායකත්වය

**යනාදී කරුණු ඇසුරින් පිළිතුර සකස් විය යුතු ය** **(ලකුණු 10 යි)**

**05 (ii) සෞන්දර්ය රසාස්වාදය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විවරණය කරන්න.**

- බුදුසමයට අනුව නිරාමිස සෞන්දර්ය ආශ්වාදය ආධ්‍යාත්මික සංවර්ධනයේ උපරිම තලය දක්වා ගෙනයා හැකි බව

  න තේ කාමා යානි චිත්‍රානි ලොකෙ - සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ

  තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලෝකේ - අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං

- ලොව විචිත්‍ර දෑ කාමයෝ නො වෙති. පුද්ගලයෙකු තුළ පවතින රාග සංකල්පය කාමයයි. විචිත්‍ර දෑ ලොව එසේ ම පවතී. නුවණැත්තෝ කාමයෙන් තොරව සෞන්දර්ය ආශ්වාද කරන බව.
- ස්වභාව සෞන්දර්ය මෙන්ම නිර්මාණාත්මක සෞන්දර්ය ද ඇලීමකින් තොරව රසවිඳීම ආධ්‍යාත්මික සංවර්ධනයට හේතුවීම
- කලාත්මක නිර්මාණයක සෞන්දර්යය විඳීමෙහිලා වීතරාගීත්වය බාධාවක් නොවන බව බුද්ධචරිතයෙන් අනාවරණය වීම (සාරන්දද, චාපාල වැනි චෛතිය ඇගයීම)
- බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සඳහා අභ්‍යාස කිරීමට තෝරාගත් ගයා ශීර්ෂය ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්ථානයක් වීම - අරියපරියේෂණ සූත්‍රය
- ආධ්‍යාත්මික ශික්ෂණය පුහුණු කළ හැකි පහසු ස්ථාන ලෙස රුක්මුල් වන සෙනසුන් නිර්දේශ කිරීම
- රහතන් වහන්සේලා ආධ්‍යාත්මික සුවයෙන් යුතුව වාසය සඳහා සොඳුරු වනපෙත් සහ ගංගාතීර තෝරාගැනීම. රමණීයානි අරඤ්ඤානි...
- ආධ්‍යාත්මික සංවර්ධනය තහවුරු කරන ධර්ම දේශනාවලදී උපමාරූපක සෞන්දර්යාත්මක කාව්‍යෝපක්‍රම භාවිත කිරීම
- ජේතවනාරාමය, පූර්වාරාමය වැනි සෞන්දර්යයෙන් අනූන ආරාම ආධ්‍යාත්මික පුහුණු මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීම
- පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනයට සෞන්දර්ය රසාස්වාදය හේතුවී ඇති බව සප්පක, කාලුදායි, වනවච්ච, සංකිච්ච, ගෝධික, සම්බල කච්චායන වැනි ථේරගාථාවලින් වීතරාගී උතුමන් සෞන්දර්ය රසාස්වාදය කළ අයුරු පැහැදිලි වන අතර අධ්‍යාත්මික සංවර්ධනයෙහිලා එම අත්දැකීම් ආදර්ශ කොට ගත හැකි බව
- සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍ර ධර්ම අතර නිර්මාණාත්මක සෞන්දර්ය රසාස්වාදය ආධ්‍යාත්මගත සංවර්ධනයට අදාළ කරගත හැකි බව

උදාහරණ : දීඝනිකායේ සක්කපඤ්හ සූත්‍රය පංචසිකගේ වීණා වාදනය ඇගයීමට ලක්කිරීම

- නිර්මාණාත්මක සෞන්දර්ය උපදවන චිත්‍ර, මූර්ති, කැටයම්, සංගීතය, ගීතය, චිත්‍රපට, නාට්‍ය, ගද්‍ය, පද්‍ය සාහිත්‍ය නිර්මාණ ආදිය නිරාමිසව රසවිඳීම, ආධ්‍යාත්මික සංවර්ධනයට හේතුකර ගත හැකි බව

යනදී කරුණු පදනම් කරගෙන පිළිතුර සකස්විය යුතුය.

**(ලකුණු 10 යි)**

Department of Examinations - Sri Lanka

**6 (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ හේතු සාධක පැහැදිලි කර, එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න.**

- බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු සබ්බකාමී, යස, රේවත හිමිවරුන්ගේ මූලිකත්වයෙන් කාලාශෝක රජුගේ අනුග්‍රහයෙන් විශාලා මහනුවර වාලුකාරාමයේදී පුරා මාස අටක් රහතන් වහන්සේලා 700 නමකගේ සහභාගිත්වයෙන් (සත්තසතිකා) දෙවන සංගායනාව පැවැත්වීම.

- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දසවස්තුව පදනම් කරගෙන දෙවන සංගායනාව පැවැත්වූ බව චුල්ලවග්ගපාළියේ සත්තසතිකක්ඛන්ධකය, දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව, බෝධිවංසය සහ නිකාය සංග්‍රහය යන මූලාශ්‍රයවල සඳහන්ව තිබීම.

- දසවස්තුව

  සිංගිලෝණකප්ප - ලුණු නැති ආහාරයකට මිශ්‍ර කර ගැනීමට අඟක ලුණු තබා භාවිතයට ගැනීම කැපය.

  ද්වංගුලකප්ප - ඉර හැරී සෙවනැල්ල අඟල් දෙකක් යනතුරු ආහාර වැළඳීම කැපය.

  ගාමන්තර කප්ප - වරක් වළඳා අවසන් කොට තවත් ගමකට ගොස් නැවත වැළඳීම කැපය.

  ආවාස කප්ප - එක් සීමාවේ නොයෙක් ආවාසවල පොහොය කර්ම කිරීම කැපය.

  අනුමති කප්ප - අනුමැතිය පසුව ලබාගැනීමේ අදහසින් සංඝකර්ම කිරීම කැපය.

  ආචිණ්ණකප්ප - සුදුසු නුසුදුසු බව ගැන නො සලකා ගුරුපරපුරෙන් පැවැත එන දේ අනුව ක්‍රියා කිරීම කැපය.

  අමථිත කප්ප - කිරිත් නොවූ දී කිරිත් නොවූ කිරි වැළඳීම කැපය.

  ජලෝගික කප්ප - රාත් නොවූ මී රාත් නොවූ නො පැසුණු සුරා පානය කැපය.

  අදසකනිසීදන කප්ප - දාවලු නොමැති ඇතිරිලි පරිහරණය කැපය.

  ජාතරූපරජතපටිග්ගහණ කප්ප - රන් රිදී මසු කහවණු පිළිගැනීම කැපය.

- රේවත හිමියන් විසින් දස වස්තුව පිළිබඳ ව සබ්බකාමී හිමියන්ගෙන් විමසූ අතර උන්වහන්සේ එම දහය අකැප වස්තු ලෙස ප්‍රතික්ෂේප කිරීම නිසා ධර්මය හා විනය සංගායනා කිරීම

- දස වස්තුව විනිශ්චය කිරීම සඳහා උබ්බාහිකාවක් පත්කළ අතර එහිදී පෙරදිග (පාචීනක) දිශාව නියෝජනය කරමින් සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝභිත, වාසභගාමී යන රහතන් වහන්සේලා හතර නමක් ද බටහිර (පාවෙය්‍යක) දිශාව නියෝජනය කරමින් රේවත, සානවාසී සම්භූත, කාකණ්ඩපුත්‍ර යස, සුමන යන රහතන් වහන්සේලා හතර නමක් ද වශයෙන් අට නමක් එයට ඇතුළත් වූ බව.

Department of Examinations - Sri Lanka

- දසවස්තුව පිළිබඳ සංගීතිකාරක භික්ෂූන්ගේ තීරණය නොපිළිගත් වජ්ජිපුත්තක භික්ෂූන් සංගීතිකාරක භික්ෂූන්ගෙන් වෙන්ව යාමෙන් මෙතෙක් නොබෙදී පැවැති භික්ෂු සංවිධානය බෙදී ගොස් නිකාය භේදයට මුල පිරුණු බව.
- ප්‍රථම ධර්ම සංගීතියේදී ඛුද්දානුඛුද්දක ශික්ෂාපද වෙනස් නොකිරීමට ගත් තීරණය දස වස්තුව ප්‍රතික්ෂේප කිරීමෙන් තව දුරටත් තහවුරු කිරීම.
- දෙවන සංගායනාව නොපිළිගත් වජ්ජිපුත්තක භික්ෂූන් මහාසංගීති නමින් වෙනම සංගායනාවක් පැවැත්වීම
- වෙන්ව ගිය භික්ෂූන් මහාසාංඝික නමින් නව නිකායක් පිහිටුවා ගැනීම සහ මුල් භික්ෂූන් ථේරිය නමින් ප්‍රකට වූ බව.
- තෙවන සංගායනාව වනවිට මහාසාංඝිකයන් නිකාය හයකට ද ථේරවාදීන් නිකාය දොළහකට ද වශයෙන් නිකාය දහඅටක් ලෙස බෙදී ගිය බව.
- මහායාන බුදුදහම ඇති වීමේ මූලාරම්භය දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූ බව.

**(ලකුණු 10 යි)**

**6 (ii) කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවය ප්‍රමාණවත් සාධක දක්වමින් ඇගයීමට ලක් කරන්න.**

- බෞද්ධයකු බවට පත් කණිෂ්ක රජු දිනපතා සිය මාලිගයෙහි භික්ෂූන් ලවා ධර්ම දේශනා පවත්වන ලද බවත්, එම දේශනාවල සඳහන් දහම් කරුණු පිළිබඳ වෙනස්කම් වටහාගත් රජු පාර්ශව වැනි වියත් භික්ෂූන් වහන්සේ සමග සාකච්ඡා කොට සිවුවන ධර්ම සංගායනාව සංවිධානය කරන ලද බව
- කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවති මෙම සංගායනාව පාර්ශව තෙරුන්ගේ නායකත්වය යටතේ පැවති අතර, ඊට රජතුමාගේ පූර්ණ අනුග්‍රහය ලැබීම
- සිවුවන ධර්ම සංගායනාව පිණිස තත්කාලීන කීර්තිමත් සර්වාස්තිවාදී පඬිවරුන් වූ පාර්ශව, වසුමිත්‍ර, බුද්ධදේව වැනි තෙරවරුන්ගේ මෙන්ම, නාගර්ජුන, අශ්වඝෝෂ වැනි මහායානික වියතුන්ගේ ද සහයෝගය ලබා ගත් බව
- රජතුමා සියලු නිකායවලට අයත් කීර්තිමත් පඬිවරුන්ගේ අවවාද අනුශාසනා ලැබ රාජ්‍ය පාලනය සිදුකළ බව
- තව ද මෙම වියත් භික්ෂූන් වහන්සේලා මෙතුමාගේ රාජ්‍ය සභාවේ ද සාමාජිකයෝ වූ බව.
- සිවුවන ධර්ම සංගායනාව අවසානයේ ත්‍රිපිටකයට විභාෂා ග්‍රන්ථ හෙවත් අටුවා සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද අතර, ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ද ලබා දෙන ලද බව
- තව ද විභාෂා ග්‍රන්ථ තඹපත්වල ලියවා ශෛලමය මඤ්ජුසාවක බහා නිදන් කොට මහා සෑයක් ඉදිකරන ලදී. එම සෑය වර්තමානයේ පවා කාශ්මීරයේ දැකිය හැකි වීම



Department of Examinations - Sri Lanka

- සිවුවන ධර්ම සංගායනාවෙන් පසු කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාව මෙන්ම විශේෂයෙන් ආසියාවේ උතුරු දිග රාජ්‍ය කරා ධර්ම ප්‍රචාරක සේවා ආරම්භ කිරීම
- කණිෂ්ක රාජ්‍ය සමයේ භාවිත කාසිවල බුදුරුව ඇතුළත් කොට තිබීමෙන් මෙතුමා විසින් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම පිණිස ප්‍රථම පියවර තබන ලද බව
- මෙම රජුගේ කාලයෙහි මොහුගේ පාලන ප්‍රදේශයක් වූ ගන්ධාරය ආශ්‍රිතව ගන්ධාර බුද්ධ ප්‍රතිමා කලාව ආරම්භ වීම
- පුරුෂපුරය (වර්තමාන පෙෂාවර් - පකිස්ථානය) තම රාජධානිය කොටගත් රජු එහි විශාල ආරාමයක් ඉදි කෙළේය. අවුරුදු හතලිස්දෙකක් වූ මෙතුමාගේ පාලන කාලයෙන් පසුව ද දීර්ඝ කාලයක් එම විහාරය මගින් බුදුදහමේ චිරස්ථිතිය වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් සපයා තිබීම
- කණිෂ්ක රජතුමා විසින් අඩි පන්සියයක් උසැති විශාල චෛත්‍යයක් ගොඩනගා අටනැලියක පමණ ධාතු නිදන් කරන ලද බව
- කණිෂ්ක රජතුමා විසින් බුදුදහමට සිදු කරන ලද අපරිමිත මෙහෙවර නිසා එතුමා දෙවන ධර්මාශෝක නමින් ද හැඳින්වෙන බව

**(ලකුණු 10 යි)**

**7 (i) නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන හා පරිපාලන ව්‍යුහය විස්තර කරන්න.**

- ඓතිහාසික තොරතුරුවලට අනුව භාරතයේ ඉපැරණි අධ්‍යාපන ආයතනයක් ව පැවති නාලන්දාව ක්‍රි. ව. 415 - 455 කාල වකවානුවේ ශක්‍රාදිත්‍ය හෙවත් පළමුවන කුමාර ගුප්ත රජතුමා විසින් විශ්වවිද්‍යාලයක් ලෙස ගොඩනගන ලදී. ඉන් අනතුරුව බුද්ධගුප්ත ( ක්‍රි. ව. 455 - 467) තථාගත ගුප්ත ( ක්‍රි. ව. 467 - 500) බාලාදිත්‍ය ( ක්‍රි. ව. 500 - 525) යන රජවරු නාලන්දා අධ්‍යාපන ආයතනයෙහි උන්නතියට විවිධාකාරයෙන් අනුග්‍රහ දක්වා ඇත.
- ක්‍රි. ව. 7 වන සියවස වනවිට නාලන්දා විශ්ව විද්‍යාලය තුළ ආචාර්ය, ශිෂ්‍ය, කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළු දසදහසකට නේවාසික පහසුකම් සැලසූ සියලු සැප පහසුකම්වලින් අනූන විශාල විද්‍යා පීඨයක් විය.

**අධ්‍යාපන ක්‍රියාවලිය**

- අධ්‍යාපනය අංශ තුනක් යටතේ සිදුවිය.
  1. ද්විතීක අධ්‍යාපනය ලැබීමට නාලන්දාව අවටින් ඇතුළත් වන පිරිස
  2. පළමු උපාධිය ලැබීමට ඇතුළත් වන පිරිස
  3. පශ්චාත් උපාධිය ලැබීමට ඇතුළත් වන පිරිස
- මූලික විෂයධාරා පහක් ක්‍රියාත්මක වීම
  1. භාෂා අධ්‍යයන
  2. දර්ශන අධ්‍යයන
  3. බුද්ධ ධර්ම අධ්‍යයන
  4. ලෞකික අධ්‍යයන
  5. ලලිතකලා අධ්‍යයන

Department of Examinations - Sri Lanka

ඉගැන්වීම් සඳහා ක්‍රම ශිල්ප කිහිපයක් භාවිතයට ගැනීම

1. දේශන ක්‍රමය
2. විවාද ක්‍රමය
3. පෞද්ගලික සාකච්ඡා ක්‍රමය

- සිසුන් ඇතුළත් කරගනු ලැබුවේ අසීරු ප්‍රවේශ පරීක්ෂණයක් තුළිනි. ප්‍රවේශ පරීක්ෂණය සිදුකරනු ලැබුවේ ද්වාර පණ්ඩිත නම් වූ ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් විසිනි. සංස්කෘත භාෂාව, සංස්කෘත ධර්ම ග්‍රන්ථ හා බුද්ධ ධර්මය පිළිබඳ සිසුන් තුළ පැවැති අවබෝධය පරීක්ෂාවට ලක්කෙරුණි.
- අධ්‍යාපනය ලබාදීමට කීර්තිමත් ආචාර්ය මණ්ඩලයක් සිටීම. ( නාගාර්ජුනපාද, ආර්යදේව, චන්ද්‍රකීර්ති, ශීලභද්‍ර, ප්‍රභාමිත්‍ර, චන්ද්‍රගෝමීන්, ජිනමිත්‍ර, ධර්මපාල, ධර්මකීර්ති, කමලශීල)
- ආචාර්යවරුන් එක්දහස් පන්සියයක් සේවය කිරීම
- සෑම ශිෂ්‍යයෙකුයටම පෞද්ගලික ගුරුවරයෙකු සිටීම
- රත්න සාගර, රත්න රංජන, රත්නෝදය යනුවෙන් මහල් නවයකින් හා මන්දිර තුනකින් යුත් පුස්තකාලය ශාස්ත්‍රාභිලාෂීන්ගේ අවශ්‍යතා සපුරාලීමට පොහොසත් විය.

**පරිපාලන ව්‍යුහය**

- සීලයෙන් ගුණයෙන් දැනුමෙන් පරිපූර්ණ වූ භික්ෂූන් වහන්සේ නමක් විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා ලෙස පත්වීම
- කුලපති හිමියන් යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් පැවැතිතීම
- මෙයින් එක් මණ්ඩලයක කාර්යභාරය වූයේ සිසුන් ඇතුළත් කිරීම, පාඨමාලා පිළියෙල කිරීම, ආචාර්යවරුනට වැඩ බෙදාදීම, විභාග පැවැත්වීම, පොත් පිටපත් කිරීම, පොත් සම්පාදනය කිරීමය.
- අනෙක් මණ්ඩලය මගින් ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු, නේවාසිකයිනට ආහාර, ගිලන්පස, වස්ත්‍ර සැපයීම, නේවාසික පහසුකම් වෙන් කිරීම හා සේවකයින් පාලනය කිරීම, ගම්වර පාලනය, ධාන්‍ය රැස්කිරීම ආදිය සිදුකරන ලදී.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නිදහස් වූ අතර නේවාසික පහසුකම් ද නොමිලයේ ලබාදුණි.

**(ලකුණු 10 යි)**

**7 (ii )ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවැති ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුකූලව හැඩගැසුණු ආකාරය පෙන්වා දෙන්න.**

- පැරණි ලක්දිව ඇදහිලි හා විශ්වාස රාශියක් පැවැති බව ඓතිහාසික වාර්තා අනුව පැහැදිලි වේ.
  - වෘක්ෂ වන්දනය
  - යක්ෂ වන්දනය
  - මළවුන් ඇදහීම
  - දේව වන්දනය
  - නාග වන්දනය
  - ග්‍රහ වස්තු වන්දනය ආදී වශයෙනි.
- බුදුසමයේ සම්ප්‍රාප්තියත් සමග මෙම ඇදහිලි හා විශ්වාසයන්ගෙන් ඇතැම් ඒවා නව්‍ය ස්වරූපයකින් වෙනස් වූ අතර ඇතැම් ඒවා සම්පූර්ණයෙන් ම අභාවයට ගිය බව දක්නට ලැබීම

Department of Examinations - Sri Lanka

- වෘක්ෂ වන්දනාව වෙනුවට බෝධි වන්දනාව හඳුන්වාදීම
- යක්ෂ වන්දනාව තුළින් සෙතක් නොවන බවත් පහත් ආත්මභාව ලැබූ අය ඉන් මුදවා ගැනීම සඳහා පින් දහම්වල නිරතවීම අවශ්‍ය බවත් පෙන්වා දීම
- යක්ෂයින් බුදුරදුන් හමුවේ දමුණු පිරිස් බවට පත් වූ අවස්ථා ඉදිරිපත්වීම
- තිසා වැවට අරක්ගත් යක්ෂයෙකු මිහිඳු හිමියන් විසින් දමනය කොට බුදුසමයේ අනුග්‍රාහකයකු බවට පත්කිරීම
- පේතවත්ථු, විමානවත්ථු, බාලපණ්ඩිත, දේවදූත යනාදී දේශනා තුළින් ලක්වැසියන් අතර පැවැති මළවුන් හා දේව වන්දනයට නව අරුත් ගැන්වීම
- මළවුන් හා දේව වන්දනය වෙනුවට පින් දහම් කොට ඔවුනට පින් පැමිණවීම
- අවිචාරවත්ව පැවැති දේව වන්දනය වෙනුවට ඉෂ්ට දේවතාවන්ට පින්දීම
- නාග වන්දනය වෙනුවට නාගයාට ගරුකිරීමට යොමුවීම
- ස්තූපය හඳුන්වාදීම තුළින් පැවැති පර්වත වන්දනයට නව අර්ථයන් සැපයීම
- ගිනි දෙවියන් පිදීම වෙනුවට පහන් පූජාව හඳුන්වා දීම
- ලාංකිකයන් බුදුසමය වැළඳ ගැනීමත් සමග දඩයමේ යාම වැනි නැකත් කෙළි සපුරා අභාවයට ගිය අතර ඒ වෙනුවට අභයදාන කටයුතු ද මාඝාත පැනවීම වැනි ක්‍රියාකාරකම් ද බෞද්ධාගමික උත්සව ද ආරම්භ වීම

**(ලකුණු 10 යි)**

**8 (i) ලක්දිව බුදුසසුනේ චිරස්ථිතිය සඳහා මහාවිහාරයෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න.**

- ශ්‍රී ලාංකේය ථේරවාද බුදුදහමේ කේන්ද්‍රස්ථානය ලෙස මහාවිහාරය ක්‍රියාත්මක වූබව
- ථේරවාදී බෞද්ධ සම්ප්‍රදායේ අනන්‍යතාවක් ලෙස විනයවාදීබව හඳුනාගත හැකි අතර මහාවිහාරය ඊට අනුගත ව ක්‍රියාකොට ඇතිබව
- මිහිඳු මාහිමියන් මුල්වීමෙන් ශ්‍රී ලංකාවේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිසක් ඇති වූ අතර මේ පිරිස ලංකාවේ විවිධ ප්‍රදේශවල විහාරාරාම ගොඩනගමින් බුදුසමය පතුරුවා හැරීමත්, ක්‍රි. පූ. පළමුවන සියවසේ වළගම්බා රාජ්‍ය සමය උදාවන තුරු මිහිඳු හිමියන් ප්‍රතිෂ්ඨාපනය කළ ථේරවාදී බුදුසමය මහාවිහාරය කේන්ද්‍ර කොටගෙන ව්‍යාප්තවීමත් නිසා රජු සහ ජනතාව බුදුසමය ආරක්ෂාකර ගැනීම සිය යුතුකම ලෙස සැලකූ බව
- මහාවිහාරය ථේරවාද අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වීම. ගිහි පැවිදි ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ශිල්ප ශාස්ත්‍ර හදාරන ලද්දේ මහා විහාරයෙන් හා මහා විහාරානුබද්ධ පිරිවෙන මගිනි.
- ථේරවාද බුදුසමයේ සුරක්ෂිතතාව වෙනුවෙන් සංඝ සංස්ථාව දේශීයකරණය කිරීමට යොමුවීම. විනය උගන්වා විනය සංගීතියක් පැවැත්වීමට කටයුතු කිරීම
- සීහළට්ඨකථා සම්පාදනය කිරීම මගින් දේශීය වශයෙන් ථේරවාද අර්ථකථන සම්ප්‍රදාය හඳුන්වාදීම. ඒ අනුව මහාට්ඨකථා, මහාපච්චරියට්ඨකථා, කුරුන්දි අට්ඨකථා, අන්ධට්ඨකථා, සංඛේපට්ඨකථා ආදි අටුවා සම්පාදනය කිරීම



Department of Examinations - Sri Lanka

- ථේරවාද ත්‍රිපිටක දහම සුරක්ෂිත කිරීමෙහිලා භාණක සම්ප්‍රදායක් ඇති කිරීම. ත්‍රිපිටකධර, විනයධර, ආභිධම්මික, සුත්තන්තික, චතුනිකායික ආදි භාණකවරුන් ඊට උදාහරණයි. ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට ක්‍රි. පූ. පළමුවන සියවස තෙක් ථේරවාද ත්‍රිපිටකය හා අටුවා ආරක්ෂා කරන ලද්දේ මෙමගිනි.
- වළගම්බා රාජ්‍ය සමයේ බැමිණිතියා සාගත සමයේදී මහාවිහාරීය භික්ෂූන් ත්‍රිපිටකය හා අටුවා මුඛ පරම්පරාගත ව සුරක්ෂිත කිරීමට දරූ දැඩි පරිශ්‍රමය මූලාශ්‍රයවල සඳහන් වනබව
- බැමිණිතියා සාගතය මගින් ඇති කළ බලපෑම් පදනම් කොටගෙන මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා සංවර්ධනය කිරීම
- ස්වාභාවික විපත් සමයන්හිදී මෙන්ම අභියෝග එල්ල වූ අවස්ථාවන්හිදී ථේරවාද බුදුසමය ආරක්ෂා කිරීම. වෛතුල්‍යවාදී අදහස් හා ධර්මධාතු සංකල්පය වැනි අදහස් ද අභයගිරික අර්ථකථන ද නො පිළිගැනීම, මහසෙන් රජුගෙන් ඇති වූ අභියෝග හමුවේ නො සැලී ථේරවාදි බුදුදහම සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම
- පාලි අටුවා රචනා කිරීමට මූලිකත්වයක් දීම
- බුද්ධඝෝස හිමියන් පරික්ෂාවට ලක්කොට සිංහල භාෂාවෙන් පැවැති හෙළ අටුවා මහාවිහාර සම්ප්‍රදාය නො ඉක්මවා පාලි භාෂාවට නැගීමට අවස්ථාව ලබාදීම. මෙමගින් ථේරවාද සම්ප්‍රදායට අයත් අර්ථකථන සම්ප්‍රදාය ස්ථාපනය කිරීමට හැකිවීම හා ලක්දිව බුදුසසුනේ චිරස්ථිතිය සඳහා කටයුතු කිරීම
- ලක්දිව පුරා මහාවිහාරයට අනුබද්ධ ආයතන ස්ථාපනය කිරීම. ඒ අනුව මූලායතන මෙන්ම ලක්දිව බොහෝ ප්‍රදේශවල විහාරස්ථාන කේන්ද්‍ර කොට අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවීම
- කුල දරුවන් පැවිදි කොට, නිසි ශික්ෂණයෙන් යුතු භික්ෂු පරපුරක් ලක්දිව පුරා ව්‍යාප්ත කිරීම

**(ලකුණු 10 යි)**

**8 (ii) "සඳකඩපහණ හෙළ කලාකරුවාගේ අදීනත්වය විදහා දක්වන විශිෂ්ට නිර්මාණයකි." විමසන්න.**

- ඉන්දියාවේ පැවති පාටිකා නමින් හැඳින් වූ නිර්මාණය පූර්වාදර්ශ කර ගනිමින් ලක්දිව සඳකඩපහණ නිර්මාණය වීම
- එය ලංකාවේදී සඳකඩපහණ, අඩ්ඪචන්ද්‍ර පාසාණ, අඩ්ඪචන්ද්‍ර පද ගණ්ඨිකා, අඩසඳපහණ යනාදි නම්වලින් ව්‍යවහාර වීම
- නාගර්ජුනකොණ්ඩ, අජන්තා ලෙන් විහාර සංකීර්ණය වැනි ස්ථානවල ඇති සඳකඩපහණ ලංකාවේ සඳකඩපහණ මෙන් කලාත්මක නොවන බව

Department of Examinations Sri Lanka

- අනුරාධපුර බිසෝමාලිගය අසල සඳකඩපහණ ලක්දිව කලාත්මක බවින් උසස්ම නිර්මාණය ලෙස සැලකේ. එහි දෙවන පේළියේ දැකිය හැකි සත්ත්ව පේළිය වමේ සිට දකුණට එකිනෙකා පසුබස දිවයන අයුරු පිළිඹිබු කරයි. සිවුවන කවයේ හමුවන හංස පේළිය අඩක් විකසිත වූ නෙළුම් පොහොට්ටුවක් මුඛයෙන් හොවාගෙන සිටීම

- අනුරාධපුර යුගයට අයත් සඳකඩපහණ තුළ ගිනිදැල් මෝස්තරය ද ගවයා, ඇතා, අශ්වයා සහ සිංහයා යන සතුන් හතරදෙනා ද ලියවැල ද හංසාවලිය ද සිහින් ලිය වැල ද අර්ධ පද්මය ද යන මෝස්තර දක්නට ලැබීම

- පොළොන්නරු යුගයේදී සඳකඩපහණින් ගවයා ඉවත් වී ඇති අතර අනෙකුත් සතුන් වෙන වෙන ම පේළිවල දක්වා තිබීම

- සඳකඩපහණේ සංකේත තුළ දාර්ශනික අර්ථ රාශියක් ගැබ්ව ඇතැයි එච්.සී.පී. බෙල්, සෙනරත් පරණවිතාන, බෙන්ජමින් රෝලන්ඩ්, විනී විතාරණ, චන්ද්‍රාවික්‍රම ගමගේ, ඩී.ටී. දේවේන්ද්‍ර වැනි විද්වතුන් ගණනාවක් අදහස් දක්වා තිබීම

- සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩපහණින් භව චක්‍රය හා විමුක්තිය සංකේතවත් කිරීම.

| | |
|---|---|
| පළාපෙති මෝස්තරය | - ගිනිදැල් ලෙස හඳුන්වා දී ඇත. සත්ත්වයා රාගාදි කෙලෙස් ගින්නෙන් දැවෙන බව |
| සතුන් හතර දෙනාගෙන් | - ජාති, ජරා, ව්‍යාධි, මරණ |
| ලියවැලෙන් | - තෘෂ්ණාව |
| හංස පේළියෙන් | - පිවිතුරුබව |
| කුඩා ලියවැල | - තුනී වූ තෘෂ්ණාව |
| නෙළුම් මල | - නිර්වාණය |

**(ලකුණු 10 යි)**

Department of Examinations - Sri Lanka